අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
**General Certificate of Education (Adv.Level) Examination, August 2016**
ගිණුම්කරණය - I/පැය දෙක යි

උපදෙස් :
- අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

1. පහත කුමන ප්‍රකාශයෙන් ආයතනයක ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වඩාත් හොඳින් විස්තර කරනු ලබයි ද?
   (1) ආයතනයක ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීම
   (2) ආයතනයක ගනුදෙනු මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා සටහන් කිරීම
   (3) ආයතනයක මූල්‍ය වාර්තා ගිණුම්කරණ ප්‍රමිත පදනම් ව පිළියෙල කිරීම
   (4) ආයතනය පිළිබඳ තොරතුරු කළමනාකරුවන්ගේ භාවිතය සඳහා සන්නිවේදනය කිරීම
   (5) ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම (.........)

2. වත්කම්, ජංගම සහ ජංගම නොවන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වර්ගීකරණය කිරීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් වන්නේ ද?
   (1) උපචිත (2) අඛණ්ඩ පැවැත්ම
   (3) ඓතිහාසික පිරිවැය (4) කාලච්ඡේද
   (5) ආරක්ෂණ (.........)

3. වසර අග තොගය, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත හඳුනාගැනීම සඳහා පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
   (1) උපචිත (2) කාලච්ඡේද
   (3) යථාරූපී (4) උපලබ්ධි
   (5) ආරක්ෂණ (.........)

WWW.KLCCOMMERCE.COM

4. ශ්‍රී ලංකාවේ අනුගමනය කරන 'මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට' අනුව මූල්‍ය තොරතුරුවල වැඩි දියුණු කිරීමේ ගුණාත්මක ගතිලක්ෂණයක් නොවන්නේ පහත දෑ අතරෙන් කුමක් ද?
   (1) සංසන්දනාත්මක බව
   (2) විශ්වාසනීය නියෝජනය
   (3) සත්‍යාපනය කළ හැකි බව
   (4) කාලීන බව
   (5) අවබෝධ කරගත හැකි බව (.........)

5. පහත කුමන ප්‍රකාශය ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි වේ ද?
   (1) සුළු මුදල් පොත ආයතනයක ලෙජර් ගිණුමක් ලෙස ද භාවිත කෙරේ.
   (2) සියලු මූලික ලියවිලි ආයතනයක ගණකාධිකාරිවරයා විසින් පිළියෙල කරනු ලබයි.
   (3) ණය පදනම මත මිල දී ගත් සියලු වත්කම් සටහන් කිරීම සඳහා ගැනුම් ජර්නලය භාවිත කෙරේ.
   (4) ආයතනයක ශේෂ පිරික්සුම තුලනය වීම එහි ගිණුම්කරණ ක්‍රියාවලියේ නිවැරදිතාව තහවුරු කරයි.
   (5) භාණ්ඩ ණයට විකුණුම් හා බැඳි සාරාංශගත තොරතුරු ණයගැති පාලන ගිණුමේ සටහන් කරයි. (.........)

6. පහත තොරතුරු සීමිත දයා පොදු සමාගමට අදාළ වේ.

| | 2016.03.31 දිනට (රු.) | 2015.03.15 දිනට (රු.) |
|---|---|---|
| ගෙවිය යුතු කුලී | - | 60 000 |
| ගෙවිය යුතු අලුත්වැඩියා වියදම් | 40 000 | 80 000 |

- 2014.04.01 දින සමාගම රු. 30 000ක මාසික කුලියකට ගොඩනැගිල්ලක් කුලියට ගන්නා ලදි.
- 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවූ කුලී සහ අලුත්වැඩියා වියදම් පිළිවෙළින් රු. 480 000ක් සහ රු. 380 000ක් විය.

2016. 03. 31 දිනට කලින් ගෙවූ කුලී සහ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අලුත්වැඩියා වියදම්:

| | කලින් ගෙවූ කුලී (රු.) | අලුත්වැඩියා වියදම් (රු.) |
|---|---|---|
| (1) | 60 000 | 340 000 |
| (2) | 60 000 | 420 000 |
| (3) | 120 000 | 340 000 |
| (4) | 480 000 | 420 000 |
| (5) | 480 000 | 300 000 |

(.........)

7. 2016.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආයතනයක් විසින් රු. 900 000ක ශුද්ධ වැටුපක් ගෙවන ලදි. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක සහ සේවායාගේ දායකත්වයන් පිළිවෙළින් 10% ක් සහ 15% ක් වන අතර ඒවා 2016 මාර්තු මාසය සඳහා වෙනෙක් ගෙවා නොමැත. සේවකයන්ගේ වැටුපෙන් කරන එක ම අඩු කිරීම සේවක අර්ථසාධක අරමුදල් දායකය වේ. මෙම ගනුදෙනුවල බලපෑම ගිණුම්කරණ සමීකරණයේ දක්වනුයේ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| (1) | රු. 900 000කින් අඩු වේ. | රු. 150 000කින් වැඩි වේ. | රු. 1 000 000කින් අඩු වේ. |
| (2) | රු. 900 000කින් අඩු වේ. | රු. 100 000කින් වැඩි වේ. | රු. 1 000 000කින් අඩු වේ. |
| (3) | රු. 900 000කින් අඩු වේ. | රු. 250 000කින් වැඩි වේ. | රු. 1 150 000කින් අඩු වේ. |
| (4) | රු. 1 000 000කින් අඩු වේ. | රු. 150 000කින් වැඩි වේ. | රු. 1 150 000කින් අඩු වේ. |
| (5) | රු. 1 000 000 කින් අඩු වේ. | – | රු. 1 000 000කින් අඩු වේ. |

(.........)

8. 2016.03.31 දිනට සීමිත රේණු පොදු සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදි. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දෑ හෙළිදරව් විය.

   A - විදුලි වියදම් සඳහා ගෙවූ රු. 200 000 මුදල් ගිණුමෙහි පමණක් සටහන් කර තිබුණි.

B - ගැනුම් ජර්නලය රු. 60 000ක් වැඩියෙන් එකතු කර තිබුණි.

C - ණයගැතියකුගෙන් ලද රු. 50 000ක් මුදල් ගෙවීමක් ලෙස ණයහිමි පාලන ගිණුමෙහි සටහන් කර තිබුණි.

D -රු. 40 000ක විකුණුම් ඉන්වොයිසියක් ණයගැති ලෙජරයේ පමණක් සටහන් කර තිබුණි.

(1) A හා C පමණි.
(2) B හා D පමණි.
(3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි.
(5) A, B, C,හා D යන සියල්ල ම (.........)

9. විවාහ මංගල උත්සව සඳහා ශාලාවක් කුලියට දීමේ නියුතු ව්‍යාපාර ආයතනයක 2016 අප්‍රේල් මාසය තුළ දී පහත ගනුදෙනු සිදු විය. මෙම ශාලාව රු. 400 000කට කුලියට දෙනු ලබන අතර ඉන් 25%ක් ශාලාව වෙන් කරන අවස්ථාවේ දී ද, ඉතිරිය විවාහ මංගල උත්සවයෙන් පසුව සතියක් ඇතුළත ද ගෙවිය යුතු වේ.

| දිනය | ගනුදෙනුව | වටිනාකම (රු.) |
|---|---|---|
| 2016.04.02 | 2016.03.28 දින පැවති විවාහ උත්සවය සඳහා ලද ඉතිරි මුදල | 300 000 |
| 2016.04.05 | 2016.04.27 දින පැවැත්වීමට නියමිත විවාහ උත්සවය සඳහා ලද අත්තිකාරම් | 100 000 |
| 2016.04.15 | 2016.05.10 දින පැවැත්වීමට නියමිත විවාහ උත්සවය සඳහා ලද අත්තිකාරම් | 100 000 |
| 2016.04.30 | 2016 අප්‍රේල් මාසය සඳහා දරන ලද මෙහෙයුම් වියදම් | 330 000 |

(.........)

2016 අප්‍රේල් මාසය සඳහා ආදායම හා ලාභය/(අලාභය) සහ 2016. 04. 30 දිනට ලැබිය යුතු දෑ කොපමණ ද?

| | ආදායම (රු.) | ලාභය/ (අලාභය) (රු.) | ලැබිය යුතු දෑ (රු.) |
|---|---|---|---|
| (1) | 200 000 | (130 000) | 600 000 |
| (2) | 400 000 | 70 000 | 300 000 |
| (3) | 500 000 | 170 000 | 600 000 |
| (4) | 700 000 | 370 000 | 300 000 |
| (5) | 800 000 | 470 000 | 600 000 |

• ප්‍රශ්න අංක 10 සහ 11ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

2016. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පාසලක ආදි ශිෂ්‍ය සංගමයකට අදාළ තොරතුරු පහත දක්වේ.

| විස්තරය | වටිනාකම (රු' 000) |
|---|---|
| සාමාජික මුදල් ලැබීම් (මෙයින් 1/4ක්, 2015. 03. 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ වේ.) | 360 |
| ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා ලද පරිත්‍යාග | 500 |
| ස්ථාවර තැන්පතුව මත උපයන ලද පොලී ආදායම | 50 |
| මුළු වියදම් | 300 |

අතිරේක තොරතුරු:

• සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 4 000කි. 2016.03.31 දිනට සංගමයේ සාමාජිකයන් 100ක් විය.
• පරිත්‍යාග ලද වර්ෂයෙන් ආරම්භ වී වර්ෂ 5ක කාලයක් තුළ දී, ආදායම ලෙස හඳුනාගැනීම සංගමයේ ප්‍රතිපත්තිය වේ.
• ස්ථාවර තැන්පතුව මත පොලී 2016.05.31 දින එය කල් පිරීමේ දී ලැබෙනු ඇත.
• සියලු වියදම් මුදලින් ගෙවා ඇත.
• 2015.03.31 දිනට මුදල් ශේෂය රු. 150 000කි.

10. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය කොපමණ ද?

(1) රු. 120 000 (2) රු. 210 000
(3) රු. 250 000 (4) රු. 520 000
(5) රු. 650 000 (.........)

11. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ශේෂයේ ශුද්ධ වැඩිවීම කොපමණ ද?

(1) රු. 470 000 (2) රු. 520 000
(3) රු. 560 000 (4) රු. 610 000
(5) රු. 860 000 (.........)

12. එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් වන සීමිත අජිත් පොදු සමාගම 2015.04.01 දින රු. 4 140 000කට යන්ත්‍රයක් මිල දී ගන්නා ලදි. මෙහි VAT සඳහා ගෙවූ රු. 540 000ක් අඩංගු වේ. මෙම යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 5ක් වන අතර එයට සුන්බුන් අගයක් නොමැත.

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම කොපමණ ද?

(1) රු. 2 448 000 (2) රු. 2 880 000
(3) රු. 3 312 000 (4) රු. 3 600 000
(5) රු. 4 140 000 (.........)

13. හවුල් ව්‍යාපාරයකට අදාළ ව පහත කුමන ප්‍රකාශය නිවැරදි වේ ද?

(1) හවුල් ව්‍යාපාරයක හිමිකම නිරූපණය කරනු ලබන්නේ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂයන් සහ වෙනත් සංචිත ඇත්නම් ඒවායේ ද එකතුවෙනි.
(2) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතෙහි 24 වන වගන්තියට අනුව හවුල්කරුවකු වේතනයකට හිමිකම් ලබනුයේ හවුල් ව්‍යාපාරයට යම් සේවාවක් සැපයූ විට පමණි.
(3) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතෙහි 24 වන වගන්තියට අනුව හවුල්කරුවන් අතර ලාභාලාභ බෙදාහරිනු ලබන්නේ ඔවුන් හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනයට දායක වී ඇති අනුපාතයට ය.
(4) හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබන්නේ හවුල්කරුවන් ඇතුළත් වූ විට දී හෝ විශ්‍රාම ගිය විට දී පමණි.
(5) හවුල්කරුවකු ඇතුළත් කරගත හැකි වන්නේ හෝ විශ්‍රාම යා හැකි වන්නේ මූල්‍ය වර්ෂයක පළමු වන හෝ අවසාන දිනයේ දී පමණි. (.........)

14. LKAS 2 (තොග) ප්‍රමිතයේ නිර්වචනයට අනුව තොග ලෙස හඳුනාගත හැකි වන්නේ පහත දෑ අතරෙන් කුමක් ද?

A - සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී විකිණීම සඳහා පවත්වා ගනු ලබන භාණ්ඩ

B - සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී විකිණීම සඳහා නිෂ්පාදනය වෙමින් පවතින අයිතම

C - නිෂ්පාදන ක්‍රියාවලියේ දී හෝ සේවා සැපයීමේ දී භාවිත කිරීමට ඇති ද්‍රව්‍ය සහ සැපයුම්

(1) A පමණි.
(2) A හා B පමණි.
(3) A හා C පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C යන සියල්ල ම (.........)

15. පහත තොරතුරු සීමිත රබිත පොදු සමාගමේ මෝටර් රථ හා බැඳේ.

| විස්තරය | රු.'000 |
|---|---|
| 2015.04.01 දිනට ධාරණ වටිනාකම | 6 500 |
| 2015.09.30 දින විකුණු මෝටර් රථය මත ඇති වූ අලාභය | 150 |
| 2016.01.01 දින නව මෝටර් රථයක් අත්පත් කරගැනීම | 4 000 |

වර්ෂය ආරම්භයේ දී පැවති සියලු මෝටර් රථ 2010.04.01 දින මිල දී ගෙන ඇත. වර්ෂය තුළ දී විකුණු මෝටර් රථය රු. 3 000 000ක පිරිවැයකට මිල දී ගෙන ඇත. මෝටර් රථ වාර්ෂික ව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ක්ෂය සහ විකුණන ලද මෝටර් රථයේ විකුණුම් වටිනාකම වනුයේ:

| | ක්ෂය (රු.'000) | විකුණුම් වටිනාකම (රු.'000) |
|---|---|---|
| (1) | 650 | 1 500 |
| (2) | 1 000 | 1 350 |
| (3) | 1 100 | 1 350 |
| (4) | 1 100 | 1 200 |
| (5) | 1 250 | 1 200 |

(.........)

16. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මානෙල් පොදු සමාගමේ සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත පරිදි වේ:

| විස්තරය | රු.'000 |
|---|---|
| දළ ලාභය | 280 |
| වියදම් (රු. 20 000ක ක්ෂය සහ රු. 10 000ක කාර්යාලීය උපකරණ විකුණුම් මත අලාභය ද ඇතුළු ව) | 100 |
| ආදායම් බදු වියදම | 80 |
| වර්ෂය සඳහා ලාභය | 100 |

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී පහත අයිතමයන්ගේ ශේෂයන් පහත පරිදි වැඩි වී ඇත.

| විස්තරය | රු.'000 |
|---|---|
| තොගය | 80 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 120 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 130 |

වර්ෂය තුළ දී ගෙවූ ආදායම් බදු රු. 50 000කි.

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

(1) රු. 10 000
(2) රු. 90 000
(3) රු. 150 000
(4) රු. 180 000
(5) රු. 230 000 (.........)

17. සීමිත ඉසුරු පොදු සමාගමේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂකවරු විසින් 2016.06.15 දින අනුමත කරන ලදී. 2016.03.31 දින සිට 2016.06.15 දක්වා කාලයේ දී පහත සිද්ධීන් සමාගමේ සිදු විය.

A - 2016.04.15 දින සිට ව්‍යාපාරයේ කොටසක් වසා දැමීමේ සැලැස්මක් නිවේදනය කරන ලද අතර, මෙමගින් වාර්ෂික ව රු. 600 000ක් ඉතිරි කිරීමට අපේක්ෂා කෙරේ.

B - රු. 1 000 000ක අලාභයක් ජනනය කරමින් 2016.04.20 දින ප්‍රධාන නිෂ්පාදන පිරියතයක් ගින්නකින් විනාශ විය.

C - 2016.04.30 දින සිදු කළ ණයට විකුණුම් නිසා ඇති වූ රු. 750 000ක ශේෂයක් සහිත ණයගැතියකු 2016.05.30 දින බුන්වත් විය.

D - 2016.06.15 දින සාමාන්‍ය කොටස් හිමියන්ට රු. 300 000ක අවසාන ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම

LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත කුමන සිදුවීම් නොගළපන සිද්ධීන් ලෙස සලකනු ලබයි ද?

(1) A හා B පමණි.
(2) B හා C පමණි.
(3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි.
(5) A, B, C හා D යන සියල්ල ම (.........)

- ප්‍රශ්න අංක 18, 19 සහ 20ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත නාමල් පොදු සමාගමට අදාළ වේ.

| විස්තරය | රු.'000 |
|---|---|
| විකුණුම් | 1 200 |
| විකුණුම් පිරිවැය | 600 |
| මෙහෙයුම් වියදම් | 300 |
| මෝටර් රථයක් විකිණීම මත ලාභය | 80 |
| සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 100 |
| ප්‍රත්‍යාගණන හිගය - කාර්යාලීය උපකරණ | 120 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය - ගොඩනැගිලි | 180 |

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාලීය උපකරණ ප්‍රත්‍යාගණනය මත රු. 90 000ක අතිරික්තයක් හඳුනාගෙන තිබුණි. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ප්‍රථම වතාවට ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ඇත.

18. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගන්නා ලද මුළු ආදායම සහ මුළු වියදම කොපමණ ද?

| | මුළු ආදායම (රු.'000) | මුළු වියදම (රු.'000) |
|---|---|---|
| (1) | 1 280 | 900 |
| (2) | 1 340 | 900 |
| (3) | 1 380 | 1 020 |
| (4) | 1 460 | 1 020 |
| (5) | 1 460 | 1 120 |

(.........)

19. LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගන්නා ලද ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම කොපමණ ද?

| | ලාභය (රු.'000) | වෙනත් විස්තීරණ ආදායම (රු.'000) | |
|---|---|---|---|
| (1) | 160 | 180 | |
| (2) | 250 | 90 | |
| (3) | 260 | 180 | |
| (4) | 350 | 90 | |
| (5) | 380 | 60 | (.........) |

20. LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම සහ රඳවාගත් ඉපැයුම් කොපමණ ද?

| | මුළු විස්තීරණ ආදායම (රු.'000) | රඳවාගත් ඉපැයුම් (රු.'000) | |
|---|---|---|---|
| (1) | 340 | 160 | |
| (2) | 340 | 250 | |
| (3) | 440 | 250 | |
| (4) | 440 | 260 | |
| (5) | 440 | 280 | (.........) |

21. වෙළෙඳ සමාගමක දළ ලාභ අනුපාතය ස්ථාවර ව තිබිය දී, පසුගිය වර්ෂය හා සැසඳීමේ දී ප්‍රවර්තන වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය අඩු වීමට පහත කුමන දෑ බලපානු ලබයි ද?

A - ප්‍රවර්තන වර්ෂයේ අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගය එහි පිරිවැයට වඩා අඩු වීම

B - පොලී ආදායම අඩු වීම

C - ගොඩනැගිලි ප්‍රථම වරට හිඟයකට ප්‍රත්‍යාගණනය කිරීම

D - සාමාන්‍ය කොටස්හිමියන්ට අතුරු ලාභාංශයක් ගෙවීම

(1) A හා B පමණි.
(2) B හා C පමණි.
(3) A, B, හා C පමණි.
(4) A, B, හා D පමණි.
(5) A, B, C හා D යන සියල්ල ම (.........)

22. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක ආදායම් ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

| | | |
|---|---|---|
| විකුණුම් | රු. | 4 000 000 |
| වර්ෂයේ ලාභය | රු. | 200 000 |
| පොලී වියදම් | රු. | 60 000 |
| ආදායම් බදු වියදම | රු. | 40 000 |

2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය කොපමණ ද?

| | ශුද්ධ ලාභ අනුපාතය (%) | පොලී ආවරණ අනුපාතය (වාර) | |
|---|---|---|---|
| (1) | 5 | 3.3 | |
| (2) | 5 | 5 | |
| (3) | 6 | 4 | |
| (4) | 6 | 5 | |
| (5) | 7.5 | 4 | (.........) |

23. පිරිවැය වර්ගීකරණයට අදාළ ව පහත කුමන ප්‍රකාශය නිවැරදි වේ ද?

(1) නිෂ්පාදිත පිරිවැය සමන්විත වන්නේ සෘජු පිරිවැයෙන් පමණි.
(2) සියලු සෘජු පිරිවැය, විචල්‍ය පිරිවැය වේ.
(3) යන්ත්‍ර ක්ෂය පාලනය කළ හැකි පිරිවැයක් ලෙස සලකනු ලබයි.
(4) පිරිවැය, හැසිරීම මත ප්‍රධාන වශයෙන් විචල්‍ය සහ ස්ථාවර ලෙස වර්ග කරනු ලැබේ.
(5) තොග මැනීම සඳහා පිරිවැය, අදාළ සහ අදාළ නොවන ලෙස වර්ග කරනු ලැබේ. (.........)

- **ප්‍රශ්න අංක 24 සිට 25ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් භාණ්ඩ නිෂ්පාදනය සඳහා 'A' අමුද්‍රව්‍ය යොදාගනී. මෙම අමුද්‍රව්‍යයේ ඇණවුමක පිරිවැය රු. 250ක් වන අතර එහි වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය ඒකකයකට රු. 100කි. 'A' අමුද්‍රව්‍යයෙහි යළි ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා සමාගම ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) ආකෘතිය භාවිත කරයි. පහත තොරතුරු 'A' අමුද්‍රව්‍යයට අදාළ වේ:

| | | |
|---|---|---|
| උපරිම පරිභෝජනය | සතියකට ඒකක | 750 |
| අවම පරිභෝජනය | සතියකට ඒකක | 250 |
| ආර්ථික ඇණවුම් ප්‍රමාණය | ඒකක | 1 000 |
| පොරොත්තු කාලය | සති | 3 (අවම)-5 (උපරිම) |

24. 'A' අමුද්‍රව්‍යයෙහි උපරිම තොග මට්ටමට කොපමණ ද?

(1) ඒකක 1 750 (2) ඒකක 2 750
(3) ඒකක 3 500 (4) ඒකක 3 750
(5) ඒකක 4 000 (.........)

25. 'A' අමුද්‍රව්‍යයෙහි වාර්ෂික ඉල්ලුම කොපමණ ද?

(1) ඒකක 200 000 (2) ඒකක 400 000
(3) ඒකක 500 000 (4) ඒකක 1 250 000
(5) ඒකක 2 500 000 (.........)

- **ප්‍රශ්න අංක 26 සිට 27ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

යන්ත්‍ර සහ නිමැවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් වන ගබඩාවකින් සමන්විත සමාගමකට පහත තොරතුරු අදාළ වේ.

| විස්තරය | යන්ත්‍ර | නිමැවුම් | ගබඩාව |
|---|---|---|---|
| අයවැයගත පොදු කාර්ය පිරිවැය | රු. 175 000 | රු. 125 000 | රු. 50 000 |
| පොදු කාර්ය පිරිවැය | යන්ත්‍ර පැයකට | ශ්‍රම පැයකට | |
| අන්තර්ග්‍රහණ අනුපාත | රු. 20 | රු. 10 | |

ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක අතරේ සමාන ව නැවත විභජනය කෙරේ. සමාගම නිපදවනු ලබන 'X' භාණ්ඩයේ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා යන්ත්‍ර පැය 2ක් සහ ශ්‍රම පැය 5ක් අවශ්‍ය වේ.

26. යන්ත්‍ර සහ නිමැවුම් දෙපාර්තමේන්තුවල භාවිත කිරීමට අපේක්ෂිත යන්ත්‍ර පැය සහ ශ්‍රම පැය පිළිවෙළින් කොපමණ ද?

| | යන්ත්‍ර පැය | ශ්‍රම පැය |
|---|---|---|
| (1) | 8 750 | 12 500 |
| (2) | 10 000 | 15 000 |

| | | | |
|---|---|---|---|
| (3) | 10 000 | 10 000 | |
| (4) | 17 500 | 6 250 | |
| (5) | 20 000 | 7 500 | (.........) |

27. 'X' භාණ්ඩයේ ඇස්තමේන්තුගත ප්‍රාථමික පිරිවැය රු. 120ක් නම්, එහි ඒකකයක නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

(1) රු. 140 (2) රු. 150
(3) රු. 160 (4) රු. 170
(5) රු. 210 (.........)

28. පිරිවැය-පරිමා-ලාභ (CVP) විශ්ලේෂණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ සත්‍ය වේ ද?

A - සමච්ඡේදන ලක්ෂ්‍යයට පසුව උපයන ලද දායකය ලාභයක් ජනනය කරයි.
B - සමච්ඡේදන ලක්ෂ්‍යයේ දී මුළු දායකය, මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.
C - සමච්ඡේදන ලක්ෂ්‍යයෙන් පසුව මුළු දායකය, මුළු ස්ථාවර පිරිවැය හා ලාභයේ එකතුවට සමාන වේ.
D - සමච්ඡේදන ලක්ෂ්‍යයට පෙර ස්ථාවර පිරිවැය මුළු දායකයට වඩා වැඩි වේ.

(1) A හා B පමණි. (2) B හා C පමණි.
(3) A, C, හා D පමණි. (4) B, C, හා D පමණි.
(5) A, B, C හා D යන සියල්ල ම (.........)

29. සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබයි. මෙම භාණ්ඩයේ ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. 200ක් වන අතර ඉන් 75%ක් විචල්‍ය වේ. සමාගම වර්තමානයේ දී ඒකක 14 000ක් නිෂ්පාදනය කරන අතර එහි දායක විකුණුම් අනුපාතය 50% කි. වර්තමාන ක්‍රියාකාරී මට්මටම ඒකක 16 000 දක්වා වැඩි වූ විට රු. 260 000ක අතිරේක ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයක් දැරීමට සමාගමට සිදු වේ.

වර්තමාන ක්‍රියාකාරී මට්ටමේ දී සමච්ඡේදන ලක්ෂ්‍යය (රුපියල්වලින්) සහ ක්‍රියාකාරී මට්ටම ඒකක 16 000 දී ඒකකයක නිෂ්පාදන පිරිවැයඃ

| | සමච්ඡේදන ලක්ෂ්‍යය (රු.'000) | ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු) | |
|---|---|---|---|
| (1) | 1 400 | 200.00 | |
| (2) | 1 400 | 210.00 | |
| (3) | 1 400 | 216.25 | |
| (4) | 4 200 | 140.00 | |
| (5) | 4 200 | 210.00 | (.........) |

30. අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය වැඩි වීමට පහත කුමන දෑ හේතු වේ ද?

A - අපේක්ෂිත මුදල් ගලාඒම් වැඩි වීම
B - ආරම්භක ආයෝජනයේ පිරිවැය අඩු වීම
C - වත්කමේ සුන්බුන් අගය වැඩි වීම
D - අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය වැඩි වීම

(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) B හා D පමණි.
(4) A, B, හා C පමණි.
(5) A, B, C හා D යන සියල්ල ම (.........)

- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.

31. පහත කාර්යයන් කළමනාකරණ ගිණුම්කරණයේ විෂයපථය තුළට ඇතුළත් වන්නේ ද යන්න සඳහන් කරන්න.

| කාර්යය | ඔව්/නැත |
|---|---|
| A - භාණ්ඩ මිල කිරීම සඳහා පිරිවැය තොරතුරු සැපයීම | ............... |
| B - පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම | ............... |
| C - දිගුකාලීන ආයෝජන ව්‍යාපෘති ඇගයීම | ............... |
| D - ගිණුම්කරණ අනුපාත මත ආයතනයක ලාභදායීත්වය විශ්ලේෂණය කිරීම | ............... |

32. රු. 1 000 000ක් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරමින් 2016.01.01 දින විශ්ව විසින් වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. ඔහු මෙම මුදලෙන් 90%ක් භාණ්ඩ මිල දී ගැනීමට වැය කළ අතර, ඒවා පිරිවැය මත 30%ක ලාභ ආන්තිකයක් සහිත ව විකුණන ලදි. 2016.03.31 දිනට ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් රු. 1 200 000ක් විය. කාලච්ඡේදය තුළ දී අමතර ප්‍රාග්ධනය හඳුන්වාදී හෝ ගැනිලි සිදු කර නොමැත.

2016.03.31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා පහත දෑ ගණනය කරන්න.

(අ) ලාභය රු. ..............................................
(ආ) මෙහෙයුම් වියදම් රු. ..............................................

33. 2016.04.01 දින සමන් රු. 100 000කට භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදි. එදින ම එම භාණ්ඩ රු. 120 000කට අත්පිට මුදලට විකුණන ලද අතර ඒ සඳහා රු. 5 000ක විකුණුම් වියදම් දරන ලදි.

පහත ආකෘතිය භාවිත කරමින් ගිණුම්කරණ සමීකරණය තුළ මෙම ගනුදෙනුවල ශුද්ධ බලපෑම පෙන්වන්න.

වත්කම් (රු)............................ = වගකීම් (රු)............................
+හිමිකම් (රු)............................

34. නිෂ්පාදන ආයතනයක ණයගැති පාලන ගිණුමේ ශේෂය වැඩි වීමට, අඩු වීමට හෝ වෙනස් නොවීමට පහත ගනුදෙනු හේතු වන්නේ ද යන්න සඳහන් කරන්න.

| ගනුදෙනුව | වැඩි වේ/ අඩු වේ/ වෙනස් නොවේ |
|---|---|
| A - භාවිත කරන ලද යන්ත්‍ර ණයට විකිණීම | ......................... |
| B - ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම | ......................... |
| C - වර්ෂය තුළ දී බොල් ණය කපා හැරීම | ......................... |
| D - වර්ෂය අවසානයේ දී අඩමාන ණය සඳහා වෙන් කිරීම | ......................... |

35. 2016.01.01 දින සමාගමක් විසින් ලැයිස්තුගත මිල රු. 500 000ක් වූ යන්ත්‍රයක් මිල දී ගන්නා ලදි. සැපයුම්කරු ගැනුම් මිල මත 10% ක වෙළෙඳ වට්ටමක් සහ ගෙවිය යුතු මුදල දින 30ක් තුළ පියවුව හොත් 5%ක මුදල් වට්ටමක් දීමට එකඟ වී ඇත. සමාගම දින 30 තුළ දී ගෙවිය යුතු වටිනාකම පියවන ලදි. පහත දෑ සඳහන් කරන්න.

(අ) යන්ත්‍රය අත්පත් කරගැනීමේ පිරිවැය රු. ............................
(ආ) 2016.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලද වට්ටම් සටහන් කිරීමට ජර්නල් සටහනඃ

..............................................................

..............................................................

..............................................................

36. 2016.03.31 දිනට සමාගමක බැංකු ශේෂය රු. 450 000ක් විය. එය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකඟ නොවී ය. මෙම ශේෂ සැසඳීමේ දී පහත දෑ හෙළිදරව් විය.

- ණයගැතියකු විසින් රු. 80 000ක චෙක්පතක් බැංකුවේ සෘජු ව තැන්පත් කර තිබුණි.
- බැංකුව විසින් කළ ස්ථාවර නියෝග ගෙවීම් රු. 40 000ක් විය.
- බැංකුවේ තැන්පත් කරන ලද රු. 60 000ක චෙක්පත අගරු වී ඇත.
- බැංකුවේ තැන්පත් කරන ලද රු. 20 000ක චෙක්පත මෙතෙක් උපලබ්ධි වී නොමැත.
- රු. 30 000ක නිකුත් කරන ලද චෙක්පත්, ගෙවීම සඳහා මෙතෙක් ඉදිරිපත් කර නොමැත.

2016.03.31 දිනට පහත දෑ ගණනය කරන්න.

(අ) සංශෝධිත බැංකු ශේෂය රු. ..............................

(ආ) බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. ..............................

37. සමාගමක් හා බැඳි පහත එක් එක් අවස්ථාව වඩාත් හොඳින් විස්තර කරනුයේ කුමන ගිණුම්කරණ සංකල්පය ද යන්න සඳහන් කරන්න.

| අවස්ථාව | ගිණුම්කරණ සංකල්පය |
|---|---|
| A - ඉඩමක සාධාරණ අගය වැඩි වුව ද එය අත්පත් කරගත් මිලට වාර්තා කිරීම | .................... |
| B - යන්ත්‍ර භාවිත කිරීමට අපේක්ෂිත කාලසීමාව තුළ දී ඒවායේ ක්ෂය හඳුනාගැනීම | .................... |
| C - ගැනුම් මිල රු. 5 000ට අඩු සියලු වත්කම්, වියදම් ලෙස හඳුනාගැනීම | .................... |
| D - තොග තක්සේරු කිරීම සඳහා පෙර-පිවිසි-පෙර-පිට මිල ක්‍රමය අඛණ්ඩ ව භාවිත කිරීම | .................... |

38. පහත එක් එක් අයිතමය හඳුනාගනු ලබන්නේ කුමන මූල්‍ය ප්‍රකාශන මූලිකාංගයෙහි ද යන්න සඳහන් කරන්න.

| අයිතමය | මූලිකාංග |
|---|---|
| A - රඳවාගත් ඉපැයුම් | .................... |
| B - ලැබිය යුතු පොලී | .................... |
| C - කාර්යාල උපකරණ විකුණුම් මත අලාභය | .................... |
| D - වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | .................... |

- ප්‍රශ්න අංක 39 සිට 40ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

ශක්ති, කල්ප සහ පවන් විසින් ලාභාලාභ පිළිවෙළින් 5:3:2 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. 2016.03.31 දින පවන් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලද අතර, එදිනට කීර්තිනාමය රු. 1 000 000කට ඇස්තමේන්තු කරන ලදි. පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනීම හවුල් ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ. ලාභාලාභ සමසම ව බෙදා ගනිමින් ශක්ති සහ කල්ප විසින් හවුල් ව්‍යාපාරය දිගට ම පවත්වා ගන්නා ලදි. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් තුළ සටහන් කරන ලද ගනුදෙනුවල සාරාංශය පහත පරිදි වේ:

| විස්තරය | ශක්ති (රු.'000) | කල්ප (රු.'000) | පවන් (රු.'000) |
|---|---|---|---|
| ලාභ කොටස | 500 | 300 | 200 |
| වේතන | 400 | 400 | 400 |
| ප්‍රාග්ධන පොලී | 300 | 200 | 100 |
| ගැනිලි | (40) | - | (20) |
| ගෙවූ වේතන | (400) | (400) | (400) |

39. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල කීර්තිනාමය ගැළපීමට අදාළ ජර්නල් සටහන:

..............................................................

..............................................................

..............................................................

..............................................................

40. පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. ....................

(ආ) විසර්ජනය කළ මුළු ලාභය: ශක්තිට රු. ....................

පවන්ට රු. ....................

41. LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව සමාගමකට ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා දෙක සඳහන් කරන්න.

(1) ..............................................................

..............................................................

(2) ..............................................................

..............................................................

42. ගනුදෙනුකරුවන් මිල දී ගන්නා භාණ්ඩ දෝෂ සහිත වූ විට එහි මිල ආපසු ගෙවීම විදුලි උපකරණ විකුණන වෙළෙඳ සැලක ප්‍රතිපත්තිය වේ. කෙසේ වුව ද එවැනි නෛතික බැඳීමක් නොමැත. LKAS 37 (ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතියට අනුව මෙහි දී ප්‍රතිපාදනයක් හඳුනාගැනීමට සම්පූර්ණ කළ යුතු නිර්ණායක තුන සඳහන් කරන්න.

(1) ..............................................................

(2) ..............................................................

(3) ..............................................................

43. LKAS 17 (කල්බදු) ප්‍රමිතියට අනුව කල්බද්දක්, මූල්‍ය කල්බද්දක් ලෙස වර්ග කිරීමට භාවිත කරන නිර්ණායක දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................

..............................................................

(2) ..............................................................

..............................................................

44. සමාගමක් නව යන්ත්‍රයක් රු. 5 500 000කට මිල දී ගන්නා ලදි. මෙම මිල දී ගැනීමට අදාළ ව කරන ලද පහත ගෙවීම් LKAS 16 (දේපළ පිරියත සහ උපකරණ) ප්‍රමිතියට අනුව හඳුනාගනු

ලබනුයේ යන්ත්‍රයේ ආරම්භක පිරිවැයෙහි ද, වියදම්වල ද යන්න අදාළ තීරුවෙහි '✓' ලකුණක් යොදමින් දක්වන්න.

| අයිතමය | වටිනාකම (රු' 000) | ආරම්භක පිරිවැය | වියදම් |
|---|---|---|---|
| A - යන්ත්‍ර ක්‍රියාකරු පුහුණු කිරීම | 120 | ............ | ............ |
| B - ස්ථාපිත කිරීම සහතික කළ ඉංජිනේරුවරයාගේ ගාස්තුව | 12 | ............ | ............ |
| C - යන්ත්‍රය අත්හදා බැලීම | 220 | ............ | ............ |
| D - උත්සවාකාරයෙන් යන්ත්‍රය විවෘත කිරීම | 150 | ............ | ............ |

45. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සමාගමකට අදාළ වේ.

- වර්ෂය තුළ දී රු. 250 000ක් පිරිවැය වූ කාර්යාල උපකරණයක් රු. 50 000ක ලාභයක් සහිත ව විකුණන ලදි. විකුණූ දිනට මෙම වත්කමේ සමුච්චිත ක්ෂය රු. 120 000ක් විය.
- 2015.04.01 දින පිරිවැය රු. 1 500 000ක් වූ ඉඩමක් රු. 500 000ක් අතැති මුදලින් ද, ඉතිරිය ඉඩම උකස් කර ලබාගත් බැංකු ණයකින් ද ගෙවා මිල දී ගන්නා ලදි. 2016.03.31 දින මෙම ණය සඳහා රු. 100 000ක පොලියක් ගෙවන ලදි.

ඉහත ගනුදෙනු තුළින් පැනනැගුණු මුදල් ප්‍රවාහයන් (වටිනාකම් සහිත ව) සහ LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව මෙම මුදල් ප්‍රවාහයන්ගේ නිසි වර්ගීකරණයන් සඳහන් කරන්න.

| | මුදල් ප්‍රවාහය | වටිනාකම (රු.) | වර්ගීකරණය |
|---|---|---|---|
| A- | .................... | .................... | .................... |
| B- | .................... | .................... | .................... |
| C- | .................... | .................... | .................... |
| D- | .................... | .................... | .................... |

46. අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී පහත එක් එක් අනුපාතයන්ගේ වැඩි වීම සමාගමක ද්‍රවශීලතාවය වැඩි දියුණු වීමක් පෙන්නුම් කරන්නේ ද යන්න සඳහන් කරන්න.

| අනුපාතය | ද්‍රවශීලතාවය වැඩි දියුණු වීම (ඔව්/ නැත) |
|---|---|
| A- ණයගැති පිරිවැටුම | :.............................. |
| B- ණය එකතු කිරීමේ කාලය | :.............................. |
| C- තොග පිරිවැටුම | :.............................. |
| D- තොග රඳවාගැනීමේ කාලය | :.............................. |

47. කමිස නිෂ්පාදනය කරන සමාගමක් විසින් පහත පිරිවැය දරන ලදි. මෙම පිරිවැය අයිතම, විචල්‍ය (V) හෝ ස්ථාවර (F) හෝ ලෙස වර්ග කර, ඒවා නිෂ්පාදිත පිරිවැයට ඇතුළත් වන්නේ ද යන්න දක්වන්න.

| පිරිවැය | V/F | නිෂ්පාදිත පිරිවැය (ඔව්/නැත) |
|---|---|---|
| A - නිපදවන ලද කමිස ප්‍රමාණය මත සේවක වේතන | .............. | .............. |
| B - කමිසවලට අල්ලනු ලබන බොත්තම්වල පිරිවැය | .............. | .............. |
| C - කර්මාන්තශාලාව සඳහා රක්ෂණ වාරිකය | .............. | .............. |
| D - නිෂ්පාදන සුපරීක්ෂකවරුන්ගේ වැටුප් | .............. | .............. |

48. වෙළෙඳ සමාගමක් තොග නිකුත් කිරීම් මිල කිරීම් සඳහා භරිත සාමාන්‍ය ක්‍රමය යොදාගනී. 2016 මාර්තු මාසයේ තොග අයිතමයකට අදාළ තොරතුරු පහත දී ඇත.

| දිනය | විස්තරය | ප්‍රමාණ (ඒකක) | මිල (රු.) |
|---|---|---|---|
| 2016.03.01 | ශේෂය | 1 000 | 10 |
| 2016.03.07 | ගැනුම් | 2 000 | 15 |
| 2016.03.14 | ගැනුම් | 4 000 | 11 |
| 2016.03.20 | විකුණුම් | 4 000 | ? |

පහත දෑ ගණනය කරන්න.

(අ) 2016 මාර්තු මාසයේ විකුණුම් පිරිවැය රු. ....................

(ආ) 2016.03.31 දිනට තොගය රු. ....................

49. සමාගමක් විසින් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කර අලෙවි කරනු ලබයි. පහත තොරතුරු එහි ඒකක 10 000ක නිෂ්පාදන මට්ටමට අදාළ වේ.

| | |
|---|---|
| ඒකකයක විකුණුම් මිල | රු. 90 |
| ඒකකයක විචල්‍ය පිරිවැය | රු. 60 |
| ස්ථාවර පිරිවැය | රු. 180 000 |

අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී වෙළෙඳ පොළ වෙනස් වීම් හේතුවෙන් ඒකකයක විකුණුම් මිල සහ විචල්‍ය පිරිවැය පිළිවෙළින් 30%කින් සහ 20% ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. පහත දෑ ගණනය කරන්නः

| අවස්ථාව | සමච්ඡේද ලක්ෂ්‍යය (ඒකක) | ආරක්ෂිත ආන්තිකය (ඒකක) |
|---|---|---|
| (අ) වෙළෙඳ පොළ තත්ත්වය වෙනස් වීමට පෙර | .............. | .............. |
| (ආ) වෙළෙඳ පොළ තත්ත්වය වෙනස් වීමට පසු | .............. | .............. |

50. සමාගමක් විසින් රු. 2 400 000කට යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. එහි ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5ක් සහ රු. 600 000ක් වේ. ක්ෂය වෙන් කිරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිත කරනු ලබයි. මෙම යන්ත්‍රයෙන් රු. 600 000ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් සෑම වර්ෂයක දී ම අපේක්ෂා කෙරේ.

පහත දෑ ගණනය කරන්න.

(අ) පිළිගෙවුම් කාලය (වසර) ....................

(ආ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය-සාමාන්‍ය ආයෝජනය මත පදනම් ව (%) ....................

❖ පළමු වන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

1. ලිපිද්‍රව්‍ය වෙළඳාමේ නියුතු සීමිත සුමේධ පොදු සමාගමේ 2016.03.31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත. මෙය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සමාගමකි.

| විස්තරය | හර (රු 000) | බැර (රු 000) |
|---|---|---|
| වැටුප් | 1 000 | |
| කුලී | 540 | |
| විදුලිය | 120 | |
| දුරකථන | 75 | |
| ගැනුම් | 6 000 | |
| VAT ගෙවීම | 600 | |
| 2015. 04. 01 දිනට දේපළ, පිරියත සහ උපකරණ | 10 000 | |
| 2015. 04. 01 දිනට තොගය | 1 200 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 7 000 | |
| බැංකුවේ ඇති මුදල් | 730 | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ගෙවන ලද ආදායම් බදු | 535 | |
| විකුණුම් | | 12 000 |
| VAT එකතු කිරීම | | 1 320 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 4 000 |
| 2015. 04. 01 දිනට රඳවාගත් ඉපැයුම් | | 2 327 |
| ප්‍රත්‍යගණන සංචිත - කාර්යාල උපකරණ | | 600 |
| කල්බදු ණයහිමියෝ | | 2 353 |
| පොදු සංචිත | | 1 200 |
| 2015. 04. 01 දිනට සමුච්චිත ක්ෂය - දේපළ, පිරියත සහ උපකරණ | | 4 000 |
| | 27 800 | 27 800 |

අතිරේක තොරතුරු:

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) වෙළෙඳ නියෝජිතයන්ට විකුණුම් මත ගෙවූ 2%ක කොමිස්, වැටුප් තුළ ඇතුළත් කර ඇත.

(ii) 2016 මාර්තු මාසය සඳහා රු. 15 000ක විදුලි බිල මෙතෙක් ගෙවා නොමැත.

(iii) 2016 මාර්තු මාසය සඳහා රු. 18 000ක දුරකථන ගාස්තු කලින් ගෙවා ඇත. කෙසේ වුව ද මාර්තු මාසය සඳහා බිල රු. 8 000ක් විය.

(iv) අයිතම ක්‍රමය මත සමාගම තොග අගය කරයි. 2016.03.31 දිනට පැවති තොගය, ලිපි ද්‍රව්‍ය අයිතම කාණ්ඩ තුනකින් සමන්විත විය. මෙදිනට ඒවායේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පහත පරිදි විය.

| කාණ්ඩය | පිරිවැය (රු. 000) | ශුද්ධ උපලබ්ධි අගය (රු. 000) |
|---|---|---|
| A | 520 | 600 |
| B | 320 | 250 |
| C | 280 | 300 |

(v) 2016.03.31 දිනට රු. 750 000ක ශේෂයක් සහිත ණයගැතියකු බුන්වත් වී ඇති බව 2016.04.30 දින ප්‍රකාශයට පත් කරන ලදි. 2016.05.15 දින සමාගමේ අධ්‍යක්ෂකවරු විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදි.

(vi) 2015.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සමුච්චිත ක්ෂයවල සංයුතිය පහත පරිදි විය.

| විස්තරය | පිරිවැය/ වටිනාකම (රු. 000) | සමුච්චිත ක්ෂය (රු. 000) | ධාරණ වටිනාකම (රු. 000) |
|---|---|---|---|
| මෝටර් රථ (කල්බදු පදනමට) - පිරිවැයට | 6 000 | 2 400 | 3 600 |
| කාර්යාල උපකරණ - සාධාරණ අගයට | 2 500 | 1 000 | 1 500 |
| ලී බඩු සහ සවි කිරීම් - පිරිවැයට | 1 500 | 600 | 900 |
| එකතුව | 10 000 | 4 000 | 6 000 |

සියලු ම වත්කම් (කල්බදු වත්කම් ද ඇතුළු ව) 2013.04.01 දින අත්පත් කරගෙන ඇති අතර එදිනට ඒවායේ ඵලදායී ජීව කාලය වසර 5ක් ලෙස ඇස්තමේන්තු කරන ලදි. ඒවා සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(vii) 2015.04.01 දින ලී බඩු සහ සවි කිරීම්වල ඉතිරි ඵලදායී ජීව කාලය වසර 6ක් ලෙස සංශෝධනය කරන ලදි. තව ද 2016.03.31 දින කාර්යාල උපකරණ රු. 1 800 000ක වෙළෙඳ පොළ අගයට ප්‍රත්‍යගණනය කරන ලදි.

(viii) මෝටර් රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිතයට ගන්නා අතර ඒවායේ කල්බදු කාලය වසර 5කි. වාර්ෂික කල්බදු වාරිකය රු. 1 583 000කි. ප්‍රවර්තන වර්ෂයේ කල්බදු වාරිකය ගෙවා ඇති අතර එය සම්පූර්ණයෙන් ම කල්බදු ණයහිමි ගිණුමට හර කර ඇත. මෙය සම්බන්ධ ව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත. කල්බදු පොලිය පහත පරිදි වේ.

| වසර | පොලිය (රු. 000) |
|---|---|
| 2013/14 | 600 |
| 2014/15 | 502 |
| 2015/16 | 394 |
| 2016/17 | 275 |
| 2017/18 | 144 |

(ix) 2016.03.31 දින සමාගම විසින් පොදු සංචිත ප්‍රාග්ධනිත කරමින් කොටසක් රු. 20 බැගින් සාමාන්‍ය කොටස් 40 000ක් දැනට සිටින කොටස්කරුවන්ට නිකුත්

කර ඇත. කෙසේ වුව ද මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් තබා නොමැත.

(x) ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බද්ද රු. 500 000ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

අවශ්‍ය වන්නේ:

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සුමේධ පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළු ව):

(1) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

(3) 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(මුළු ලකුණු 20 යි)**

2. (අ) ලාභාලාභ සම සමව බෙදාගන්නා රංග සහ එරංග උපදේශන සේවා සපයන ව්‍යාපාරයක හවුල්කරුවන් වූහ. 2015.04.01 දින උදාර හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා ලදි. සංශෝධනය කරන ලද හවුල් ව්‍යාපාර ගිවිසුම පහත පරිදි වේ.

- රංග, එරංග සහ උදාර පිළිවෙළින් ලාභාලාභ 2:2:1 අනුපාතයට බෙදාගනු ලබයි.
- හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගන්නා අතර කීර්තිනාමයට අදාළ සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් සටහන් කරයි.
- හවුල්කරුවන් වර්ෂ අවසාන ප්‍රාග්ධන ශේෂ මත 10%ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.
- එරංගට සහ උදාරට රු.40 000 බැගින් මාසික වේතනයක් හිමි වේ.
- හවුල් ව්‍යාපාරයට ලබාදෙන ණය සඳහා හවුල්කරුවන් වාර්ෂික ව 8%ක පොලියකට හිමිකම් ලබයි.

2016.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි විය:

| විස්තරය | | හර (රු: 000) | බැර (රු: 000) |
|---|---|---|---|
| උපදේශන ආදායම් ............................ | | | 8 600 |
| උපදේශන වියදම්......................... | | 3 500 | |
| මෙහෙයුම් වියදම්........................... | | 1 200 | |
| එරංගට ගෙවූ වේතන........................ | | 480 | |
| 2016.01.01 දින උදාර ලබාදුන් ණය ........ | | | 2 000 |
| උදාරට ගෙවූ ණය පොලී .................. | | 30 | |
| 2016.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ-ධාරණ වටිනාකමට ................ | | 6 000 | |
| දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය..... | | 1 800 | |
| වෙනත් ආදායම් ............................ | | | 100 |
| බැංකුවේ ඇති මුදල් ........................ | | 290 | |
| 2015.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම් | රංග ....... | | 1 000 |
| | එරංග ..... | | 1 000 |
| 2015.04.01 දිනට ජංගම ගිණුම් | රංග ........ | | 200 |
| | එරංග ......... | | 100 |
| උදාර රැගෙන ආ මුදල ........................ | | | 300 |
| | | 13 300 | 13 300 |

අතිරේක තොරතුරු:

(i) උදාර පහත දෑ ප්‍රාග්ධනය ලෙස ගෙන එන ලදි.

| | රු' 000 |
|---|---|
| කාර්යාල උපකරණ | 700 |
| මුදල් | 300 |

කෙසේ වුව ද උදාර ගෙන ආ මුදල පමණක් ගිණුම් පොත්වල සටහන් කර තිබුණි.

(ii) උදාර බඳවා ගන්නා අවස්ථාවේ දී හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1 800 000ක් ලෙස ඇස්තමේන්තු කරන ලදි.

(iii) දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය මත වාර්ෂික ව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iv) 2016.01.01 දින හවුල් ව්‍යාපාරය සේවාදායකු වෙත මාසික ව රු.100 000ක ගාස්තුවකට උපදේශන සේවා සැපයීම සඳහා ගිවිසුමකට ඇතුළත් විය. මෙදින සේවාදායකයා රු. 500 000ක් ගෙවූ අතර එය උපදේශන ආදායම් ලෙස සටහන් කර තිබුණි.

(v) 2016.03.31 දින හවුල් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකඟ නොවී ය. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දෑ අනාවරණය විය.

- බැංකුවේ සෘජු ව තැන්පත් කරන ලද රු. 300 000ක උපදේශන ආදායමක් ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.
- උපදේශන සේවාවක් වෙනුවෙන් රංගගේ බිරිඳගෙන් ලද රු. 50 000ක චෙක්පතක් බැංකුවේ තැන්පත් කළ නමුත් මෙතෙක් උපලබ්ධි වී නොමැත. මෙය වෙනත් ආදායම් ලෙස සටහන් කර ඇත.
- බාහිර උපදේශකයන්ට නිකුත් කළ රු. 250 000ක චෙක්පත් ගෙවීමට ඉදිරිපත් කර නොතිබුණි.
- එරංගගේ රු. 50 000ක නිවාස ණය වාරිකය ස්ථාවර නියෝග මත හවුල් ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් ගෙවා ඇති මුත් ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

අවශ්‍ය වන්නේ:

(1) 2016.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය සහ බැංකු සැසඳුම් ප්‍රකාශනය

(2) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේආදායම්ප්‍රකාශනය(විසර්ජනයක්සහිත ව)

(3) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්

**(ලකුණු 10යි)**

(ආ) සපත්තු නිෂ්පාදනයේ නියුතු ඩෙල්වින් සමාගමට නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ නඩත්තු කටයුතු සඳහා වූ සේවා දෙපාර්තමේන්තුවක් ඇත. ඒකක 5 000ක ක්‍රියාකාරී මට්ටමේ දී ඉදිරි වර්ෂය සඳහා අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

| විස්තරය | එකතුව | නිෂ්පාදන දෙපාර්තමේන්තුව A | නිෂ්පාදන දෙපාර්තමේන්තුව B | නඩත්තු දෙපාර්තමේන්තුව |
|---|---|---|---|---|
| වක්‍ර වැටුප් (රු.) | 75 000 | 46 000 | 13 000 | 16 000 |
| යන්ත්‍ර ක්ෂය (රු.) | 30 000 | 20 000 | 10 000 | – |
| කුලී (රු.) | 90 000 | ? | ? | ? |

| | | | | |
|---|---|---|---|---|
| ආරක්ෂක ගාස්තු (රු.) | 45 000 | ? | ? | ? |
| විදුලිය (රු.) | 80 000 | ? | ? | ? |
| යන්ත්‍ර පැය | 15 000 | 10 000 | 5 000 | – |
| ශ්‍රම පැය | 14 000 | 2 000 | 12 000 | – |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 9 000 | 3 800 | 3 600 | 1 600 |
| ආරක්ෂක සේවකයන් සංඛ්‍යාව | 15 | 7 | 7 | 1 |
| කිලෝ වොට් පැය | 1 600 | 1 000 | 500 | 100 |

අතිරේක තොරතුරු:

(i) නඩත්තු දෙපාර්තමේන්තුවේ මුළු පොදු කාර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු A සහ B අතර පිළිවෙළින් 5:3 අනුපාතයට විභජනය කළ යුතු ය.

(ii) A නිෂ්පාදන දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය ද, B නිෂ්පාදන දෙපාර්තමේන්තුව ශ්‍රම පැය ද, පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය සඳහා යොදාගැනේ.

(iii) සපත්තු යුගලයක් නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදන දෙපාර්තමේන්තු A සහ B හි පිළිවෙළින් පැය 5ක් සහ පැය 3ක් ගත කරයි.

(iv) එක් සපත්තු යුගලයක් නිෂ්පාදනය කිරීම සඳහා සෘජු පිරිවැය

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | යුගලයකට | රු. 30 |
| ශ්‍රමය | යුගලයකට | රු. 20 |

(v) නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය:

| | | |
|---|---|---|
| විචල්‍ය | යුගලයකට | රු. 25 |
| ස්ථාවර | | රු. 105 000 |

අවශ්‍ය වන්නේ:

(1) විභජන පදනම නම් කරමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) සපත්තු යුගලයක නිෂ්පාදන පිරිවැය

(4) ක්‍රියාකාරී මට්ටම ඒකක 5000 දී මුළු පිරිවැය

(ලකුණු 10යි.)

(මුළු ලකුණු 20යි.)

3. සමන් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ රු. 600 000ක ලාභයක් වාර්තා කරන ලදි. 2016.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.50 000ක මුදල් ශේෂයක් පෙන්වන ලදි. කෙසේ වුව ද ඔහු ගිණුම් පොත් නිසියාකාර ව පවත්වා නොගනී. පහත ගනුදෙනු ගිණුම් පොත්වල වාර්තා කර නොමැති බව පසුව හෙළිදරව් විය.

| අංකය | ගනුදෙනුව |
|---|---|
| 1. | රු. 80 000කට භාණ්ඩ ණයට විකිණීම. මෙම භාණ්ඩවල පිරිවැය රු. 60 000ක් විය. |
| 2. | රු. 36 000කට ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම. මෙම භාණ්ඩවල පිරිවැය රු. 30 000ක් විය. |
| 3. | පිරිවැය රු. 10 000ක් වූ භාණ්ඩ පරිත්‍යාග කිරීම |
| 4. | ව්‍යාපාරයේ නඩත්තු වියදම් රු. 10 000ක් විය. මෙයින් රු. 6 000ක් සමන් විසින් පුද්ගලික ව ගෙවන ලද අතර ඉතිරිය ව්‍යාපාරය විසින් ගෙවන ලදි. |
| 5. | 2015.07.01 දින රු. 12%ක වාර්ෂික පොලිය රු.300 000ක බැංකු ණයක් ලබාගැනීම. පොලිය මෙතෙක් ගෙවා නොමැත. |
| 6. | 2016.03.31 දින රු. 280 000ක අත්පිට මුදලට ත්‍රී රෝද රථයක් මිල දී ගැනීම |
| 7. | ණයගැතියකුගෙන් අය විය යුතු රු. 30 000ක් ඔහුට ණයහිමියකු ලෙස ගෙවිය යුතු වූ රු. 50 000කට එරෙහි ව හිලව් කිරීම, ඉතිරිය මුදලින් ගෙවන ලදි. |
| 8. | රු. 12 000ක් සමන්ගේ ජීවිත රක්ෂණ වාරිකය වෙනුවෙන් ගෙවා ඇත. |
| 9. | ගනුදෙනු අංක 1ට අදාළ ව ලැබිය යුතු මුදල 5%ක වට්ටමක් අඩු කිරීමෙන් පසු ලැබීම |
| 10. | පෙර වර්ෂයක දී බොල් ණය ලෙස කපා හල රු. 15 000ක් ලැබීම |

අවශ්‍ය වන්නේ:

(1) මෙම ගනුදෙනුවල බලපෑම (අගයන් සහිත ව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (-) ද යන්න සඳහන් කරන්න. (පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

රු. '000

| ගනුදෙනු අංකය | වත්කම: දේපළ, පිරියත සහ උපකරණ | වත්කම: තොග | වත්කම: වෙළෙඳ ලැබිය යුතු දෑ | වත්කම: මුදල් | වගකීම: දිගුකාලීන ණය | වගකීම: වෙළෙඳ ගෙවිය යුතු දෑ | වගකීම: වෙනත් ගෙවිය යුතු දෑ | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

(2) 2016.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය

(3) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ලාභය (හිමිකම මත ගනුදෙනුවල ශුද්ධ බලපෑම පදනම් ව)

(මුළු ලකුණු 15 යි)

4. දිමුතු ඔහුගේ පුද්ගලික ඉතුරුම්වලින් රු. 900 000ක් ආයෝජනය කරමින් 2016.04.01 දින නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. 2016 අප්‍රේල් මාසය තුළ

දී සිදු කරන ලද ගනුදෙනුවල සාරාංශය පහත දී ඇත.

(i) මුදල් ලැබීම් සහ ගෙවීම් ජර්නල්වල සටහන් කළ ගනුදෙනුවල සාරාංශය:

| | |
|---|---|
| ලැබීම්: | රු' 000 |
| විකුණුම් | 6 000 |
| ණයගැතියන්ගෙන් ලැබීම | 2 000 |
| ගෙවීම්: | |
| අමුද්‍රව්‍ය ගැනුම් | 1 200 |
| ණයහිමියන්ට ගෙවීම් | 800 |
| අමුද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා ගෙවූ අත්තිකාරම් | 300 |
| යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ වේතන | 400 |
| නිෂ්පාදන සුපරීක්ෂකවරුන්ගේ වැටුප් | 700 |
| කර්මාන්තශාලා විදුලිය | 60 |
| කර්මාන්තශාලා කුලී | 600 |
| පරිපාලන වියදම් | 200 |
| යන්ත්‍රයක් මිල දී ගැනීම (2016.04.01 දින) | 4 000 |

(ii) අනෙකුත් මූලික සටහන් පොත්වල එකතුන්:

| | |
|---|---|
| | රු. 000 |
| විකුණුම් ජර්නලය | 12 000 |
| ගැනුම් ජර්නලය | 8 000 |
| ආපසු එවුම් ජර්නලය | 500 |

(iii) අමුද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් ගෙවූ අත්තිකාරම සඳහා රු. 100 000ක් වටිනා අමුද්‍රව්‍ය පමණක් 2016.04.27 දින ලැබුණි. මෙය මෙතෙක් ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(iv) ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු. 300 000ක් අය කරගත නොහැකි අතර එය බොල්ණය ලෙස කපා හැරිය යුතු වේ.

(v) මාසික කර්මාන්තශාලා කුලිය රු. 200 000ක් වන අතර පළමු කාර්තුව සඳහා කුලී ගෙවා ඇත.

(vi) 2016 අප්‍රේල් මාසය සඳහා රු. 50 000ක් වූ විදුලි බිල 2016.05.10 දින ලැබී ඇත.

(vii) යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 10ක් වන අතර සුන්බුන් අගය රු. 400 000කි. යන්ත්‍ර, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(viii) මාසය අවසානයේ දී තොග ශේෂයන් පහත පරිදි විය.

| | |
|---|---|
| | රු'000 |
| අමුද්‍රව්‍ය | 300 |
| නොනිමි ද්‍රව්‍ය (නිෂ්පාදන පිරිවැයට අගය කළ) | 80 |
| නිමි භාණ්ඩ | 100 |

අවශ්‍ය වන්නේ:

(1) 2016 අප්‍රේල් මාසය සඳහා පොදු ලෙජරයේ පහත ගිණුම් (T ආකෘතිය භාවිත කරමින්):
   (i) විකුණුම්
   (ii) ණයගැති පාලන
   (iii) අමුද්‍රව්‍ය ගැනුම්
   (iv) ණයහිමි පාලන
   (v) අත්තිකාරම් ගෙවීම්

(2) 2016 අප්‍රේල් මාසය සඳහා නිෂ්පාදන ගිණුම

(3) 2016 අප්‍රේල් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

(4) 2016.04.30 දිනට පහත අයිතමවල අගයන්:
   (i) දේපළ, පිරියත සහ උපකරණ
   (ii) ඉදිරියට ගෙවූ වියදම්
   (iii) හිමිකම්

**(මුළු ලකුණු 15 යි)**

5. (අ) නිෂ්පාදන සමාගමක් එහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා දැනට පවතින යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 5කි. පහත ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් මෙම යන්ත්‍ර දෙක හා බැඳේ.

| විස්තරය | නව යන්ත්‍රය (රු 000) | දැනට පවතින යන්ත්‍රය (රු 000) |
|---|---|---|
| පිරිවැය ..................... | 1 000 | - |
| වර්තමාන වෙළෙඳ පොළ වටිනාකම... | - | 300 |
| සුන්බුන් වටිනාකම ..................... | 200 | - |
| වාර්ෂික මෙහෙයුම් පිරිවැය: ............. | | |
| වර්ෂය 1 ..................... | 100 | 300 |
| වර්ෂය 2 ..................... | 100 | 300 |
| වර්ෂය 3 ..................... | 120 | 320 |
| වර්ෂය 4 ..................... | 120 | 320 |
| වර්ෂය 5 ..................... | 140 | 360 |

නව යන්ත්‍රය මිල දී ගන්නේ නම් ව්‍යාපෘතිය ආරම්භයේ දී රු. 280 000ක අතිරේක කාරක ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එය ව්‍යාපෘතිය අවසානයේ දී නැවත ලබාගත හැකි ය. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10%කි.

10% වට්ටම් සාධක (දශමස්ථාන දෙකකට) පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

අවශ්‍ය වන්නේ:

(1) මෙම ව්‍යාපෘතියේ මුදල් ගලායාම් සහ ගලා ඒම් ඇතුළත් ලේඛනයක්

(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය

(3) ශුද්ධ වර්තමාන අගය මත පදනම් ව ව්‍යාපෘතිය තෝරාගැනීම පිළිබඳ නිර්දේශය

**(ලකුණු 05 යි.)**

(ආ) පාසලක ගුරුවරුන්ගේ සුභසාධක සංගමයක් එහි සාමාජිකයින් සඳහා සුහද හමුවක් සංවිධානය කරමින් සිටී. මෙම සංගමයේ සාමාජිකත්වය දැනට සේවයෙහි නියුතු ගුරුවරුන් 120කින් සහ විශ්‍රාමික ගුරුවරුන් 30කින් සමන්විත වේ. මෙම හමුව සඳහා පහත වියදම් ඇස්තමේන්තු කර ඇත.

| | | රු. |
|---|---|---|
| සංග්‍රහ වියදම් | එක් සාමාජිකයකුට | 1 100 |
| සමරු කලාපය | එක් සාමාජිකයකුට | 225 |
| තෑගි පාර්සලය | එක් සාමාජිකයකුට | 775 |

| | |
|---|---|
| හෝටල් ගාස්තු | 35 000 |
| ශාලා සැරසිලි | 5 000 |
| ශබ්ද විකාශන යන්ත්‍ර කුලී | 2 000 |
| හමුව සංවිධානය කිරීමේ වියදම් | 3 000 |

විශ්‍රාමික ගුරුවරුන් ද ඇතුළු ව සහභාගී වන සියලු ගුරුවරුන්ට ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමට සංගමය බලාපොරොත්තු වේ. ප්‍රවේශ පත්‍රයක් රු. 3 000කට මිල කර ඇත. අතිරික්ත මුදල් පුණ්‍ය කටයුත්තක් සඳහා යොදවනු ඇත.

අවශ්‍ය වන්නේ:

සුහද හමුවට අදාළ ව පහත දෑ ගණනය කරන්න:

(1) එක් ගුරුවරයකු මත දායකය
(2) මුළු පිරිවැය ආවරණය කිරීමට සහභාගී විය යුතු ගුරුවරු සංඛ්‍යාව
(3) සියලු ම ගුරුවරුන් සහභාගී වන්නේ නම්, පුණ්‍ය කටයුත්ත සඳහා පරිත්‍යාග කළ හැකි මුදල
(4) රු. 27 000ක් පුණ්‍ය කටයුතු සඳහා පරිත්‍යාග කිරීම පිණිස සහභාගී විය යුතු ගුරුවරු සංඛ්‍යාව
(5) සියලු ම ගුරුවරුන් සහභාගී වන්නේ නම්, ප්‍රවේශ පත්‍රයක් විකිණිය හැකි අවම මිල
(6) විශ්‍රාමික ගුරුවරුන්ට ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීම අවශ්‍ය නොවන්නේ නම් සහ ඔවුන්ගෙන් 24 දෙනෙකු පැමිණීම අපේක්ෂා කරන්නේ නම්, මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා විකිණිය යුතු ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 15 යි)

6. (අ) 2016.03.01 දින ස්ථාපිත කරන ලද මිගාර අධ්‍යාපන ආයතනය පාසල් හැර යන්නන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි. ආයතනයෙහි ස්ථිර ගුරුවරුන් දෙදෙනෙකු සහ තාවකාලික ගුරුවරයකු සේවයේ යොදවා ඇත. එක් ගුරුවරයකු මසකට පැය 120ක් ඉගැන්විය යුතු ය.

(i) ගුරුවරුන්ගේ දළ වැටුප පහත අයිතමයන්ගෙන් සමන්විත වේ.

| | | | |
|---|---|---|---|
| • ඉගැන්වීම සඳහා ගෙවීම් (පැය 120 සඳහා): | | | |
| • ස්ථිර-එක් ගුරුවරයකුට | මාසික ව | රු. | 75 000 |
| තාවකාලික | පැයකට | රු. | 500 |
| • අතිරේක සැසි පැවැත්වීම සඳහා ගෙවීම් | පැයකට | රු. | 750 |
| • පිළිතුරු පත්‍ර ලකුණු කිරීමේ ගාස්තු | පත්‍රයකට | රු. | 100 |

(ii) 2016 මාර්තු මාසය සඳහා ඉගැන්වූ පැය ගණන සහ ලකුණු කළ පිළිතුරුපත් සංඛ්‍යාව පහත පරිදි වේ.

| විස්තරය | ස්ථිර: | | තාවකාලික: |
|---|---|---|---|
| | නන්දනී | සුරේෂ් | මංජුල |
| මාසය තුළ වැඩ කළ පැය ගණන | 140 | 160 | 180 |
| ලකුණු කළ පිළිතුරුපත් සංඛ්‍යාව | 100 | 150 | 200 |

(iii) සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවක භාරකාර අරමුදල් (ETF) දායකත්වයන්, ස්ථිර මෙන් ම තාවකාලික ගුරුවරුන්ගේ දළ වැටුප මත පදනම් වේ. සේවායා සහ සේවක EPF දායකත්වයන් පිළිවෙළින් 15%ක් සහ 10%ක් වේ. ETF සඳහා සේව්‍යයාගේ දායකත්වය 3% ක් වේ.

අවශ්‍ය වන්නේ:

2016 මාර්තු මාසය සඳහා:
(1) වැටුප් ලේඛනය
(2) වැටුප් පාලන ගිණුම (ලකුණු 05 යි)

(ආ) 2013.04.01 දින පාසලක ආදි ශිෂ්‍යාවන්ගේ සංගමයක් ස්ථාපිත කරන ලදි. එහි ආරම්භක සාමාජිකාවන් රු. 500 000ක් දායක වෙමින් යාවජීව සාමාජිකයින් ලෙස බැඳුණි. මෙම සංගමයේ පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

| විස්තරය | 2016.03.31 දිනට (රු 000) | 2015.03.31 දිනට (රු 000) |
|---|---|---|
| ලැබිය යුතු සාමාජික මුදල් ................ | 20 | 15 |
| කලින් ලද සාමාජික මුදල් ................ | 30 | 25 |
| සමුච්චිත අරමුදල ................................ | ? | 200 |
| යාවජීව සාමාජික අරමුදල ................ | ? | 400 |
| ටී ෂර්ට් තොගය - පිරිවැයට ............ | 40 | - |
| ශාලාව වෙන් කිරීමේ අත්තිකාරම ... | - | 25 |
| සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු දෑ .. | ? | - |
| මුදල් ................................................ | ? | 50 |

අතිරේක තොරතුරු:

(i) එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 500කි. 2016.03.31 දිනට සාමාජිකයන් 600 දෙනෙකු (යාවජීව සාමාජිකයින් හැර) විය.
(ii) යාවජීව සාමාජික මුදල වසර 10ක කාලයක් තුළ ආදායමෙහි හඳුනාගැනේ.
(iii) සංගමයට අරමුදල් රැස් කිරීම සඳහා 2015.10.01 දින පවත්වන ලද සංගීත ප්‍රසංගයට පහත තොරතුරු අදාළ වේ.

| විස්තරය | මුදල් ලැබීම්/ ගෙවීම් (රු 000) |
|---|---|
| ප්‍රවේශ පත්‍ර විකුණුම්: | |
| එකක් රු. 1 000 බැගින් වන ප්‍රවේශ පත්‍ර 100ක් | 100 |
| එකක් රු. 500 බැගින් වන ප්‍රවේශ පත්‍ර ........ 400ක් (80%ක් පමණක් ලැබුණි) | 160 |
| ප්‍රසංගය සඳහා අනුග්‍රාහක දායකත්වයන් ..... (75% පමණ එකතු කර ඇත.) | 375 |
| සංගීතඥයින්ට ගෙවීම්: | |
| එක් අයෙකුට රු. 40 000 බැගින් ................ ගායකයින් 5 දෙනෙකුට | 200 |
| සංගීත කණ්ඩායමට ........................................ | 80 |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, අගෝස්තු 2016

General Certificate of Education (Adv.Level) Examination, August 2016

# ගිණුම්කරණය - පිළිතුරු - I

## 2016 - පිළිතුරු පත්‍රය

| ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 5 | 16 | 2 |
| 02 | 2 | 17 | 5 |
| 03 | 5 | 18 | 4 |
| 04 | 2 | 19 | 4 |
| 05 | 1, 5 | 20 | 3 |
| 06 | 1 | 21 | 3 |
| 07 | 3 | 22 | 2 |
| 08 | 1 | 23 | 4 |
| 09 | 2 | 24 | 5 |
| 10 | 3 | 25 | 1 |
| 11 | 3 | 26 | 2 |
| 12 | 2 | 27 | 5 |
| 13 | 1 | 28 | 5 |
| 14 | 5 | 29 | 2 |
| 15 | 5 | 30 | 4 |

(1 සිට 30 දක්වා එක් පිළිතුරකට ලකුණු 04 බැගින් ලකුණු 120 යි.)

WWW.KLCOMMERCE.COM

31. A - ඔව් (01)
    B - නැත (01)
    C - ඔව් (01)
    D - ඔව් (01)

32. (අ) ලාභය - රු. 200 000 (02)
    (ආ) මෙහෙයුම් වියදම - රු. 70 000 (02)

33. වත්කම් (රු) 115 000 (01) = වගකීම් (රු) 100 000 (01) + හිමිකම් (රු) 15 000 (02)

34. A - වෙනස් නොවේ. (01)
    B - අඩු වේ. (01)
    C - අඩු වේ. (01)
    D - වෙනස් නොවේ. (01)

35. (අ) රු. 450 000 (02)
    (ආ) යන්ත්‍ර සැපයුම්කරුගේ ගිණුම හර රු. 22 500
    ලද වට්ටම් ගිණුම රු. 22 500 } (02)

36. (අ) රු. 430 000 (02)
    (ආ) රු. 440 000 (02)

37. A - ඓතිහාසික පිරිවැය සංකල්පය (01)
    B - ගැළපුම් සංකල්පය/ කාලච්ඡේද සංකල්පය (01)
    C - ප්‍රමාණාත්මක බවේ සංකල්පය (01)
    D - සංගතතා සංකල්පය (01)

38. A - හිමිකම් (01)
    B - වත්කම් (01)
    C - වියදම් (01)
    D - වගකීම් (01)

39.

ප්‍රාග්ධන ගිණුම - කල්ප හර රු. 200 000
ප්‍රාග්ධන ගිණුම - පවන් බැර රු. 200 000 (04)

| විකල්පය | හර(රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම - ශක්ති | 500 000 | |
| ප්‍රාග්ධන ගිණුම - කල්ප | 500 000 | |
| ප්‍රාග්ධන ගිණුම - ශක්ති | | 500 000 |
| ප්‍රාග්ධන ගිණුම - කල්ප | | 300 000 |
| ප්‍රාග්ධන ගිණුම - පවන් | | 200 000 |

(04)

40. (අ) රු. 2 800 000 (02)
(ආ) ශක්ති රු. 1 200 000 (01)
පවන් රු. 700 000 (01)

41. (1) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් ඉල්ලා ඇති විට දී (02)
(2) ව්‍යාපාරයෙහි මූල්‍ය තත්ත්වය, මූල්‍ය ප්‍රතිඵලය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ව විශ්වසනීය සහ වඩාත් අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් ලබාදීම සඳහා (02)

42. (1) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් තිබීම (නෛතික හෝ සම්මුතික)
(2) එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලායාමේ භව්‍යතාවයක් තිබීම
(3) බැඳීමට අදාළ වටිනාකම පිළිබඳ ව විශ්වාසදායී ඇස්තමේන්තුවක් කළ හැකි වීම (04)

43. (1) කල් බදු කාලසීමාව අවසානයේ දී වත්කමෙහි නීත්‍යානුකූල අයිතිය කල්බදු ගැනුම්කරුට පැවරීම
(2) වත්කමෙහි සාධාරණ අගයට වඩා සැලකිය යුතු අඩු මිලකට ඉදිරියේ දී වත්කම මිල දී ගැනීමට අවස්ථාවක් කල්බදු ගැනුම්කරුට හිමි අතර කල්බදු ගැනුම්කරු විසින් එම අවස්ථාව භාවිතයට ගනු ඇති බවට කල්බද්ද ආරම්භයේ දී ම සාධාරණ ලෙස නිශ්චය කළ හැකි වීම
(3) වත්කමෙහි අයිතිය කල්බදු ගැනුම්කරුට නොපැවරුණ ද, වත්කමේ ආර්ථික ජීව කාලයෙන් සැලකිය යුතු ප්‍රමාණයකට කල්බදු කාලසීමාව අදාළ වීම
(4) කල්බද්ද ආරම්භයේ දී අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය අවම වශයෙන් වත්කමෙහි සාධාරණ අගය ආවරණය කිරීම
(5) කල්බද්දට යටත් වත්කම සුවිශේෂී ස්වභාවයක් දරන විට එය ප්‍රධාන වෙනස් කිරීමකින් තොර ව වෙනත් පාර්ශ්වයකට භාවිත කළ නොහැකි වීම

(ඕනෑ ම නිර්ණායක 2ක් සඳහා ලකුණු 02 බැගින්) (04)

44.

| | ආරම්භක පිරිවැය | වියදම |
|---|---|---|
| A | - | ✓(01) |
| B | ✓(01) | - |
| C | ✓(01) | - |
| D | - | ✓(01) |

45. මුදල් ප්‍රවාහය
A - උපකරණ විකිණීමෙන් ලද මුදල්
B - ඉඩම් මිලට ගැනීම
C - බැංකු ණය මුදල්
D - ගෙවූ ණය පොලී

| වටිනාකම (රු.) | වර්ගීකරණය | |
|---|---|---|
| 180 000 | ආයෝජන ක්‍රියාකාරකම් | (01) |
| 1 500 000/500 000 | ආයෝජන ක්‍රියාකාරකම් | (01) |
| 1 000 000 | මූල්‍ය ක්‍රියාකාරකම් | (01) |
| 100 000 | මූල්‍ය/ මෙහෙයුම් ක්‍රියාකාරකම් | (01) |

46. A - ඔව්. (01)
B - නැත. (01)
C - ඔව්. (01)
D - නැත. (01)

47.

| | V/F | නිෂ්පාදිත පිරිවැය (ඔව්/ නැත) |
|---|---|---|
| A | V | ඔව් |
| B | V | ඔව් |
| C | F | ඔව් |
| D | F | ඔව් |

(ඕනෑ ම නිවැරදි අයිතම 2කට 01 බැගින්) (04)

48. (අ) රු. 48 000 (02)
(ආ) රු. 36 000 (02)

49.

| | සමච්ඡේදන ලක්ෂ්‍යය (ඒකක) | | ආරක්ෂිත අන්තිකය (ඒකක) | |
|---|---|---|---|---|
| (අ) | 6 000 | (01) | 4 000 | (01) |
| (ආ) | 4 000 | (01) | 6 000 | (01) |

50 (අ) වසර 4 (02)
(ආ) 16% (02)

| | |
|---|---|
| 1 සිට 30 දක්වා | 120 |
| 31 සිට 50 දක්වා | 80 |
| **එකතුව** | **200** |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
**General Certificate of Education (Adv.Level) Examination, August 2016**
ගිණුම්කරණය II පිළිතුරු පත්‍රය

ප්‍රශ්න අංකය 1

(1)

සීමිත සුමේධ පොදු සමාගම
2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (01)
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | සටහන් | රු'000 | |
|---|---|---|---|
| විකුණුම් | | 12 000 | |
| විකුණුම් පිරිවැය | | (6 100) | (01) |
| දළ ලාභය | (01) | (5 900) | |
| බෙදාහැරීමේ පිරිවැය | | (2 190) | (03) |
| පරිපාලන වියදම් | | (2 150) | (05) |
| වෙනත් වියදම් | | (50) | (01) |
| මූල්‍ය පිරිවැය | | (394) | (01) |
| බදු පෙර ලාභය | 1 (01) | 1 116 | |
| ආදායම් බදු | | (500) | (01) |
| කාලච්ඡේදයේ ලාභය | (01) | 616 | |
| **වෙනත් විස්තීරණ ආදායම** | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස් වීම | | 800 | (01) |
| මුළු විස්තීරණ ආදායම | (01) | 1 416 | |

- සටහන 01: බදු පෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම් ද අඩු කිරීමෙන් පසුව ය.

| | | රු'000 |
|---|---|---|
| තොග කපා හැරීම | (02) | 50 |
| ක්ෂය | | 1 850 |
| කල්බදු පොලී | | 394 |

(ඕනෑ ම අයිතම දෙකකට ලකුණු 2 යි.)

(ලකුණු 20)

**පෙරවැඩ**

| | |
|---|---|
| **විකුණුම් පිරිවැය** | |
| 2015.04.01 තොගය | 1 200 |
| ගැනුම් | 6 000 |
| 2016.03.31 තොගය | (1 100) [01] |
| | 6 100 |
| **පරිපාලන වියදම්** | |
| වැටුප් | 760 [01] |
| විදුලි ගාස්තු | 135 [01] |
| දුරකථන | 65 [01] |
| කුලී | 540 |
| ලී බඩු හා සවි කිරීම් ක්ෂය | 150 [01] |
| කාර්යාල උපකරණ ක්ෂය | 500 [01] |
| | 2 150 |
| **බෙදාහැරීමේ පිරිවැය** | |
| විකුණුම් කොමිස් | 240 [01] |
| බොල්ණය | 750 [01] |
| මෝටර් රථ ක්ෂය | 1 200 [01] |
| | 2 190 |
| **වෙනත් වියදම්** | |
| තොග කපා හැරීම | 50 [01] |
| **මූල්‍ය පිරිවැය** | |
| කල්බදු පොලී | 394 [01] |

(2)

සීමිත සුමේධ පොදු සමාගම
2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

(රු'000)

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය-සාමාන්‍ය කොටස් | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිතය | රඳවාගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|---|
| 2015.04.01 දිනට ශේෂය | 4 000 | 600 | 1 200 | 2 327 | 8 127 |
| සංචිත ප්‍රාග්ධනීකරණය | 800 (01) | | (800) | | |
| මුළු විස්තීරණ ආදායම | | (01) 800 | | (01) 616 | 1 416 |
| 2016.03.31 ශේෂය | 4 800 | 1 400 | 400 | 2 943 | 9 543 |

(ලකුණු 03)

(3)

සීමිත සුමේධ පොදු සමාගම
2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (01)

| | සටහන් | රු'000 | රු'000 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 2 | | (01) 4 950 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 1 050 | (01) |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | | 6 250 | (01) |
| ඉදිරියට ගෙවූ දුරකථන ගාස්තු | | 10 | (01) |
| ඉදිරියට ගෙවූ ආදායම් බදු | | 35 | (01) |
| මුදල් හා මුදල් සමාන දෑ | | 730 | 8 075 |
| මුළු වත්කම් | | | 13 025 |
| **හිමිකම** | | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| සාමාන්‍ය කොටස් | (02) | | 4 800 |
| **සංචිත** | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 1 400 | |
| පොදු සංචිතය | | 400 | |
| රඳවාගත් ඉපැයුම් | | 2 943 | 4 743 |
| මුළු හිමිකම | | | 9 543 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| කල්බදු ණයහිමියෝ | | | 1 439 (01) |
| **ජංගම වගකීම්** | | | |
| කල්බදු ණයහිමියෝ | | 1 308 | (01) |
| උපචිත විදුලි ගාස්තු | | 15 | (01) |
| ගෙවිය යුතු VAT | | 720 | (01) 2 043 |
| මුළු වගකීම් සහ හිමිකම | | | 13 025 |

• සටහන 2: දේපළ, පිරියත හා උපකරණ (රු'000)

| | මෝටර් රථ | කාර්යාල උපකරණ | ලී බඩු සහ සවි කිරීම් | එකතුව |
|---|---|---|---|---|
| **පිරිවැය** | | | | |
| 2015.04.01 දිනට ශේෂය | 6 000 | 2 500 | 1 500 | 10 000 |
| ප්‍රත්‍යාගණනය | | 800 (01) | | 800 |
| ප්‍රත්‍යාගණනය මත සමුච්චිත ක්ෂය මාරු කිරීම | | (1 500) (01) | | (1 500) |
| 2016.03.31 දිනට ශේෂය | 6 000 | 1 800 | 1 500 | 9 300 |
| **සමුච්චිත ක්ෂය** | | | | |
| 2015.04.01 දිනට ශේෂය | 2 400 | 1 000 | 600 | 4 000 |
| කාලච්ඡේදයේ ක්ෂය | (02) 1 200 | 500 | 150 | 1 850 |
| ප්‍රත්‍යාගණනය මත සමුච්චිත ක්ෂය මාරු කිරීම | | (1 500) (01) | | (1 500) |
| 2016.03.31 දිනට ශේෂය | 3 600 | - | 750 | 4 350 |
| 2016.03.31 දිනට ධාරණ වටිනාකම | 2 400 | 1 800 | 750 | 4 950 |

වර්ෂය තුළ කාර්යාල උපකරණ රු. 1 800 000කට ප්‍රත්‍යාගණනය කර රු.800 000ක අතිරික්තයක් ඇති වී ඇත. (ලකුණු 17)

ප්‍රශ්න අංක 1

| 1 | 2 | 3 | එකතුව |
|---|---|---|---|
| 20 | 03 | 17 | 40 |

ප්‍රශ්න අංකය 2

(1) සංශෝධිත මුදල් ශේෂය - රු. 540 000 (02)

| | | | |
|---|---|---|---|
| පෙරවැඩ | | රු. | |
| බැංකු ශේෂය | - | 290 000 | |
| උපදේශන ආදායම් | - | 300 000 | [01] |
| | - | 590 000 | |
| අඩු කළා | | | |
| ස්ථාවර නියෝග මත ගෙවූ එරංගගේ ණය වාරිකය | | (50 000) | [01] |
| | | 540 000 | |

2016. 03. 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (රු'000)

| | |
|---|---|
| බැංකු ගිණුමට අනුව ශේෂය - | (01) 540 |
| <u>එකතු කළා -</u> | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් | 250 (01) |
| | 790 |
| <u>අඩු කළා</u> | |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | (50) (01) |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | 740 |

(ලකුණු 05)

(2)

රංග, එරංග සහ උදාර හවුල් ව්‍යාපාරය
2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(රු'000)

| | | |
|---|---|---|
| <u>ආදායම්</u> | | |
| උපදේශන ආදායම් | | 8 750 (02) |
| උපදේශන වියදම් | | (3 500) |
| දළ ලාභය | | 5 250 (01) |
| වෙනත් ආදායම් | | 50 |
| | | 5 300 |
| <u>වියදම්</u> | | |
| මෙහෙයුම් වියදම් | 1 200 (01) | |
| ක්ෂය වීම | 1 870 (01) | |
| ණය පොලී | 40 | (3 110) |
| වර්ෂයේ ලාභය | | (01) 2 190 |
| ප්‍රාග්ධන පොලී- රංග | 118 | |
| එරංග | 118 | |
| උදාර | 64 | (01) (300) |
| වේතන- එරංග | 480 | |
| උදාර | 480 | (960) |
| ලාභ කොටස්- රංග | (01) 372 | |
| එරංග | 372 | |
| උදාර | 186 | (930) |

(ලකුණු 08)

| පෙරවැඩ | රු'000 |
|---|---|
| උපදේශන ආදායම් | 8 600 |
| සටහන් නොවූ ආදායම් (සෘජු තැන්පතු) | 300 |
| ඉදිරියට ලද උපදේශන ආදායම් | (200) |
| වෙනත් ආදායම් ලෙස සටහන් වීම | 50 |
| | 8 750 |

02

(3)

ප්‍රාග්ධන ගිණුම් (රු'000)

| | රංග | එරංග | උදාර | | රංග | එරංග | උදාර |
|---|---|---|---|---|---|---|---|
| කීර්ති නාමය | 720 | 720 | 360 (01) | ශේෂය ඉ/ගෙ | 1 000 | 1 000 | - |
| | | | | මුදල් | - | - | (01) 300 |
| | | | | කාර්යාල උපකරණ | - (01) | - | 700 |
| ශේෂය ප/ගෙ | 1 180 | 1 180 | 640 | කීර්ති නාමය | 900 | 900 | - |
| | 1 900 | 1 900 | 1 000 | | 1 900 | 1 900 | 1 000 |

ජංගම ගිණුම් (රු'000)

| | රංග | එරංග | උදාර | | රංග | එරංග | උදාර |
|---|---|---|---|---|---|---|---|
| ගැනිලි | - | 50 (01) | - | ශේෂය ඉ/ගෙ | 200 | 100 | - |
| ගෙවූ ණය පොලී | - | - | 30 | ණය පොලී | - | - | (01) 40 |
| | | | | ප්‍රාග්ධන පොලී | 118 | 118 | 64 |
| ගෙවූ වේතන | - | 480 | - | වේතන (02) | - | 480 | 480 |
| ශේෂය ප/ගෙ | 690 | 540 | 740 | ලාභ කොටස් | 372 | 372 | 186 |
| | 690 | 1070 | 770 | | 690 | 1 070 | 770 |

(ලකුණු 07)

(ආ) (1) පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (රු.'000)

| ආයිතමය | විභජන පදනම | එකතුව | නිෂ්පාදන දෙපාර්තමේන්තු A | නිෂ්පාදන දෙපාර්තමේන්තු B | සේවා දෙපාර්තමේන්තුව නඩත්තු |
|---|---|---|---|---|---|
| වක්‍ර වැටුප් | සැබෑ | 75 000 | 46 000 | 13 000 | 16 000 (01) |
| යන්ත්‍ර ක්ෂය | සැබෑ | 30 000 | 20 000 | 10 000 | – |
| කුලිය | බිම් ප්‍රමාණය (38: 36: 16) (01) | 90 000 | 38 000 | 36 000 | 16 000 (01) |
| ආරක්ෂක ගාස්තු | සේවක සංඛ්‍යාව (7: 7: 1) (01) | 45 000 | 21 000 | 21 000 | 3 000 (01) |
| විදුලිය | කිලෝවොට් පැය (10: 5: 1) (01) | 80 000 | 50 000 | 25 000 | 5 000 (01) |
| | | 320 000 | 175 000 | 105 000 | 40 000 |
| නඩත්තු දෙපාර්තමේන්තු පොදු කාර්යය පිරිවැය නැවත විභජනය | (5:3) | – | (01) 25 000 | (01) 15 000 | (40 000) |
| | | 320 000 | 200 000 | 120 000 | – |

(ලකුණු 09)

(2) පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

A — යන්ත්‍ර පැයකට = රු. 20 (02)

B — ශ්‍රම පැයකට = රු. 10 (02)

පෙරවැඩ-

A: [01] $\frac{200\ 000}{10\ 000\ [01]}$ = රු.20

B: [01] $\frac{120\ 000}{12\ 000\ [01]}$ = රු.10

(ලකුණු 04)

(3) සපත්තු යුගලයක නිෂ්පාදන පිරිවැය රු. 180 (03)

| පෙරවැඩ | | රු. | |
|---|---|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | | 30 | [01] |
| සෘජු ශ්‍රමය | | 20 | |
| පොදු කාර්ය පිරිවැය | A - 20×5 | 100 | [01] |
| | B - 10×3 | 30 | [01] |
| | | 180 | |

(ලකුණු 03)

(4) ඒකක 5000 දී මුළු පිරිවැය රු. 1 130 000 (04)

| පෙරවැඩ | රු. | |
|---|---|---|
| නිෂ්පාදන පිරිවැය 5 000×180 | 900 000 | [02] |
| නිෂ්පාදන නොවන - විචල්‍ය 5 000×25 | 125 000 | [01] |
| ස්ථාවර පිරිවැය | 105 000 | [01] |
| | 1 130 000 | |

(ලකුණු 04)

ප්‍රශ්න අංක 2

| | 1 | 2 | 3 | 4 | එකතුව |
|---|---|---|---|---|---|
| අ | 05 | 08 | 07 | - | 20 |
| ආ | 09 | 04 | 03 | 04 | 20 |
| | | | | | 40 |

ප්‍රශ්න අංක 3

(1) (රු.000)

| ගනුදෙනු අංකය | වත්කම: දේපළ, පිරියත සහ උපකරණ | වත්කම: තොග | වත්කම: වෙළෙඳ ලැබිය යුතු දෑ | වත්කම: මුදල් | වගකීම: දිගුකාලීන ණය | වගකීම: වෙළෙඳ ගෙවිය යුතු දෑ | වගකීම: වෙනත් ගෙවිය යුතු දෑ | හිමිකම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | -60 | +80 | | | | | +20 | (02) |
| 2 | | +30 | -36 | | | | | -6 | (02) |
| 3 | | -10 | | | | | | -10 | (01) |
| 4 | | | | -4 | | | | +6 -10 | (03) |
| 5 | | | | +300 | +300 (01) | | +27 | -27 | (02) |
| 6 | +280 | | | -280 | | | | | (01) |
| 7 | | | -30 | -20 | | -50 | | | (03) |
| 8 | | | | -12 | | | | -12 | (01) |
| 9 | | | -80 | +76 | | | | -4 | (03) |
| 10 | | | | +15 | | | | +15 | (02) |
| | 280 | -40 | -66 | 75 | 300 | -50 | 27 | 28 | |

(ලකුණු 21)

(2) (රු'000)

2016.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය 125 (04)

| පෙරවැඩ | (රු'000). | |
|---|---|---|
| නිවැරදි කිරීමට පෙර මුදල් ශේෂය | 50 | 01 |
| ඉහත ගනුදෙනුවලින් වූ බලපෑම | 75 | 03 |
| | 125 | |

(ලකුණු 04)

**විකල්ප පෙරවැඩ**

මුදල් ගිණුම (රු'000)

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 50 | නඩත්තු වියදම් | 4 |
| බැංකු ණය | 300 | ත්‍රීරෝද රථ ගැනුම් | 280 |
| ණයගැති ලැබීම් | 76 | ණයහිමියන්ට ගෙවීම් | 20 |
| කපාහල බොල් ණය ආපසු ලැබීම | 15 | ගැනිලි (රක්ෂණ වාරික ගෙවීම) | 12 |
| | | ශේෂය ප/ගෙ | 125 |
| | 441 | | 441 |

(අවසාන ශේෂය හැර ඕනෑම අයිතම 2කට ලකුණු 01 බැගින්
(ලකුණු 04)

(රු'000)

(3) සංශෝධිත ලාභය රු. 578 (05)

| පෙරවැඩ | (රු'000) | |
|---|---|---|
| කෙටුම්පත් ලාභය | 600 | |
| (-) හිමිකමේ අඩු වීම | (28) | 02 |
| (+) ගැනිලි | 12 | 01 |
| (-) අමතර ප්‍රාග්ධනය | (6) | 01 |
| සංශෝධිත ලාභය | 578 | |

| විකල්ප පෙරවැඩ | (රු'000) | |
|---|---|---|
| කෙටුම්පත් ලාභය | 600 | |
| දළ ලාභයෙහි වැඩි වීම | 20 | 01 |
| ආපසු එවුම් | (6) | 01 |
| වියදම් (10 000+10 000+27 000+4 000) | (51) | 01 |
| බොල් ණය ආපසු ලැබීම | 15 | 01 |
| | 578 | |

ප්‍රශ්න අංක 3

| 1 | 2 | 3 | එකතුව |
|---|---|---|---|
| 21 | 04 | 05 | 30 |

ප්‍රශ්න අංක 4

(1)

(i) විකුණුම් ගිණුම (රු'000)

| | | | |
|---|---|---|---|
| ලාභාලාභ ගිණුම | 18 000 | මුදල් | 6 000 (01) |
| | | ණයගැති පාලන | 12 000 (01) |
| | 18 000 | | 18 000 |

(ii) ණයගැති පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| විකුණුම් (01) | 12 000 | මුදල් | 2 000 (01) |
| | | ආපසු එවුම් | 500 (01) |
| | | බොල් ණය | 300 (01) |
| | | ශේෂය ප/ගෙ | 9 200 |
| | 12 000 | | 12 000 |

(iii) අමුද්‍රව්‍ය ගැනුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 1 200 (01) | ලාභාලාභ ගිණුම | 9 300 |
| ණයහිමි පාලන | 8 000 (01) | | |
| අත්තිකාරම් | 100 (01) | | |
| | 9 300 | | 9 300 |

(iv) ණයහිමි පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 800 (01) | ගැනුම් | 8 000 (01) |
| ශේෂය ප/ගෙ | 7 200 | | |
| | 8 000 | | 8 000 |

(v) අත්තිකාරම් ගෙවීම් ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 300 (01) | අමුද්‍රව්‍ය ගැනුම් | 100 (01) |
| | | ශේෂය ප/ගෙ | 200 |
| | 300 | | 300 |

(ලකුණු 13)

(2)

දිමුතු නිෂ්පාදන ව්‍යාපාරය (රු'000)

2016 අප්‍රේල් මාසය සඳහා නිෂ්පාදන ගිණුම

| | | | |
|---|---|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | | 9 300 | (01) |
| 2016.04.30 දිනට තොගය | | (300) | (01) |
| පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය | | 9 000 | |
| **සෘජු වේතන** | | | |
| යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ වේතන | | 400 | (01) |
| ප්‍රාථමික පිරිවැය | | 9 400 | |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | | | |
| නිෂ්පාදන සුපරීක්ෂක වැටුප් | 700 (01) | | |
| විදුලිය | 50 (01) | | |
| කර්මාන්ත ශාලා කුලී | 200 (01) | | |
| යන්ත්‍ර ක්ෂය | 30 (01) | 980 | |
| | | 10 380 | |
| 2016.04.30 දිනට නොනිමි තොගය | | (80) | (01) |
| මුළු නිෂ්පාදන පිරිවැය | | 10 300 | |

(ලකුණු 08)

(3)

දිමුතු නිෂ්පාදන ව්‍යාපාරය
2016 අප්‍රේල් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය (රු'000)

| | | |
|---|---|---|
| විකුණුම් | 18 000 (01) | |
| ආපසු එවුම් | (500) (01) | 17 500 |
| නිෂ්පාදන පිරිවැය | (01) 10 300 | |
| 2016.04.30ට නිමි තොගය | (100) (01) | (10 200) |
| දළ ලාභය | | 7 300 |
| වියදම් | | |
| පරිපාලන වියදම් | 200 } (01) | |
| බොල්ණය | 300 } | (500) |
| ලාභය | | 6 800 |

(ලකුණු 05)

(රු'000)

(4) (i) 2016.04.30 දිනට දේපළ, පිරියත හා උපකරණ 3 970 (01)

| පෙරවැඩ | (රු'000) |
|---|---|
| යන්ත්‍රයේ පිරිවැය | 4 000 |
| ක්ෂය | (30) [01] |
| | 3 970 |

(රු'000)

(ii) ඉදිරියට ගෙවූ වියදම් 410 (02)

| පෙරවැඩ | (රු'000) |
|---|---|
| ඉදිරියට ගෙවූ කුලී | 400 [01] |
| ඉදිරියට ගෙවූ විදුලිය | 10 [01] |
| | 410 |

(රු'000)

(iii) හිමිකම 7 700 (01)

| පෙරවැඩ | (රු'000) |
|---|---|
| 2016.04.01ට ප්‍රාග්ධනය | 900 |
| ලාභය | [01] 6 800 |
| | 7 700 |

(ලකුණු 04)

ප්‍රශ්න අංක 4

| 1 | 2 | 3 | 4 | එකතුව |
|---|---|---|---|---|
| 13 | 08 | 05 | 04 | 30 |

ප්‍රශ්න අංක 5

(අ)(1) මුදල් ප්‍රවාහ

(රු'000)

| අයිතමය / වර්ෂය | 0 | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|---|
| මුදල් ගලා ඒම | | | | | | |
| පැරණි යන්ත්‍රය විකිණීම | 300 (01) | | | | | |
| මෙහෙයුම් පිරිවැයේ ඉතිරිය | | 200 | 200 | 200 | 200 | 220 |
| කාරක ප්‍රාග්ධනය ආපසු ලැබීම | | | | | | 280 (01) |
| සුන්බුන් අගය | | | | | | 200 (01) |
| | 300 | 200 | 200 | 200 | 200 | 700 |
| මුදල් ගලා යෑම | | | | | | |
| යන්ත්‍රයේ පිරිවැය | (1 000) (01) | | | | | |
| කාරක ප්‍රාග්ධනය | (280) (01) | | | | | |
| | (1 280) | - | - | - | - | - |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | (980) | 200 | 200 | 200 | 200 | 700 |

(මෙහෙයුම් පිරිවැයේ ඉතිරිය: දෙකකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු (02))

(ලකුණු 07)

(2) ශුද්ධ වර්තමාන අගය (NPV) = 1 068 000 - 980 000

= රු.88 000 (02)

(ලකුණු 02)

පෙරවැඩ (රු'000)

| වර්ෂ | ශුද්ධ මුදල් ප්‍රවාහ | වට්ටම් සාධක | වර්තමාන අගය |
|---|---|---|---|
| 0 | (980) | 1.0 | (980) |
| 1 | 200 | 0.91 | 182 |
| 2 | 200 | 0.83 | 166 |
| 3 | 200 | 0.75 | 150 |
| 4 | 200 | 0.68 | 136 |
| 5 | 700 | 0.62 | 434 |
| | | ශුද්ධ වර්තමාන අගය | 88 |

([01] ශුද්ධ මුදල් ප්‍රවාහ; [01] වර්තමාන අගය)

(3) ශුද්ධ වර්තමාන අගය ධන බැවින් ව්‍යාපෘතිය පිළිගැනීම යෝග්‍ය වේ. (01) (ලකුණු 01)

(ආ) (1) එක් ගුරුවරයකු මත දායකය = රු.900 (04)

**පෙරවැඩ**

| විකුණුම් ආදායම | - | විචල්‍ය පිරිවැය | | |
|---|---|---|---|---|
| 3 000 [01] | | 2 100 [03] | = | 900 |

| විචල්‍ය පිරිවැය: | | |
|---|---|---|
| සංග්‍රහ වියදම් | 1 100 | [01] |
| සමරු කලාපය | 225 | [01] |
| තෑගි පාර්සලය | 775 | [01] |
| | 2 100 | |

(2) මුළු පිරිවැය ආවරණය කිරීමට සහභාගි විය යුතු ගුරුවරු සංඛ්‍යාව - 50 (05)

**පෙරවැඩ**

$$\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකක දායකය}} = \frac{45\ 000\ [04]}{[01]\ 900}$$

| ස්ථාවර පිරිවැය: | | |
|---|---|---|
| හෝටල් ගාස්තුව | 35 000 | [01] |
| ශාලා සැරසිලි | 5 000 | [01] |
| ශබ්ද විකාශන යන්ත්‍ර කුලී | 2 000 | [01] |
| හමුව සංවිධානය කිරීමේ වියදම් | 3 000 | [01] |
| | 45 000 | |

(3) සියලු ම ගුරුවරුන් සහභාගි වන්නේ නම් පුණ්‍ය කටයුත්ත සඳහා පරිත්‍යාග කළ හැකි මුදල - රු. 90 000 (03)

**පෙරවැඩ**

| | | |
|---|---|---|
| මුළු දායකය = [01] 900 × 150 [01] | = | 135 000 |
| (-) ස්ථාවර පිරිවැය | = | 45 000 |
| | | 90 000 |

**විකල්ප පෙරවැඩ**

[01] 900 × (150 - 50) [01] [01] = 90 000

(4) රු.27 000ක් පුණ්‍ය කටයුතු සඳහා පරිත්‍යාග කිරීම පිණිස සහභාගි විය යුතු ගුරුවරු සංඛ්‍යාව - 80 (03)

**පෙරවැඩ**

$$\frac{\text{ස්ථාවර පිරිවැය + පරිත්‍යාග මුදල}}{\text{ඒකක දායකය}}$$

$$[01]\ \frac{45\ 000 + 27\ 000\ [01]}{[01]\ 900} = 80$$

(5) සියලු ම ගුරුවරු සහභාගි වන්නේ නම් ප්‍රවේශපත්‍රයක් විකිණිය හැකි අවම මිල - රු.2 400 (03)

**පෙරවැඩ**

$$= \frac{\text{මුළු පිරිවැය}}{\text{සහභාගි වන ගුරුවරු සංඛ්‍යාව}}$$

$$= \frac{[01]\ 315\ 000 + [01]\ 45\ 000}{150\ [01]}$$

= 2 400

**විකල්ප පෙරවැඩ**

150 [01] = [01] 45 000

මිල - 2 100 [01]

මිල = 300 + 2 100

= 2 400

(6) විශ්‍රාමික ගුරුවරුන්ට ප්‍රවේශපත්‍ර මිල දී ගැනීම අවශ්‍ය නොවන්නේ නම් සහ ඔවුන්ගෙන් 24 දෙනෙකු පැමිණීම අපේක්ෂා කරන්නේ නම් මුළු පිරිවැය ආවරණය කරගැනීමට විකිණිය යුතු ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව - 106 (02)

**පෙරවැඩ**

$$= \frac{\text{ආවරණය කරගත යුතු පිරිවැය}}{\text{ඒකක දායකය}}$$

$$= \frac{45\ 000 + 50\ 400\ [01]}{900\ [01]}$$

= 106

ප්‍රශ්න අංක 5

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| අ | 07 | 02 | 01 | - | - | - | 10 |
| ආ | 04 | 05 | 03 | 03 | 03 | 02 | 20 |
| | | | | | | | 30 |

ප්‍රශ්න අංක 6

(අ)(1)

මිගාර අධ්‍යාපන ආයතනය

2016 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය

| සේවකයාගේ නම | මූලික වැටුප | අතිරේක සැඟ දීමනා | පිළිකුරු තබු දීමනා | දළ වැටුප | සේවක අර්ථ සාධක අරමුදල් | ශුද්ධ වැටුප | සේවක EPF දායකය | සේවක ETF දායකය |
|---|---|---|---|---|---|---|---|---|
| කාන්දනී | 75 000 | 15 000 | 10 000 | 100 000 | 10 000 | 90 000 | 15 000 | 3 000 |
| සුරේෂ් | 75 000 | 30 000 | 15 000 | 120 000 | 12 000 | 108 000 | 18 000 | 3 600 |
| මංජුල | 60 000 | 45 000 | 20 000 | 125 000 | 12 500 | 112 500 | 18 750 | 3 750 |
| | 210 000 | 90 000 | 45 000 | 345 000 | 34 500 | 310 500 | 51 750 | 10 350 |
| | (01) | (01) | (01) | (01) | (01) | | (01) | (01) |

(2)*

වැටුප් පාලන ගිණුම (රු'000)

| | | | |
|---|---|---|---|
| සේවක අර්ථ සාධක අරමුදල (01) | 34 500 | වැටුප් හා වේතන (01) | 345 000 |
| මුදල්/ ගෙවිය යුතු වැටුප් (01) | 310 500 | | |
| | 345 000 | | 345 000 |

(ලකුණු 03)

(ආ) (1)

මුදල් ගිණුම (රු'000)

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 50 | ගායකයින්ට ගෙවීම් | 200 } |
| ප්‍රවේශපත්‍ර විකිණීම | 260 (01) | සංගීත කණ්ඩායමට ගෙවීම් | 80 } |
| අනුග්‍රාහක දීමනා | 375 (01) | ශාලා කුලිය | 50 } (02) |
| සාමාජික මුදල් | 300 (01) | සංග්‍රහ වියදම් | 30 } |
| ටී - ෂර්ට් විකුණුම් | 75 (01) | ටී - ෂර්ට් ගැනුම් | 100 (01) |
| | | වැටුප් | 360 (01) |
| | | ශේෂය ප/ගෙ | 240 |
| | 1 060 | | 1 060 |

(ලකුණු 08)

(2) (රු'000)

(i) සාමාජික මුදල් ආදායම - 350 (01)

පෙරවැඩ (රු'000)

සාමාජික මුදල් = 600 × 500 = 300
යාවජීව සාමාජික මුදල් = 50 [01]
350

(රු'000)

(ii) සංගීත ප්‍රසංගයේ අතිරික්තය - 415 (04)

පෙරවැඩ සංගීත ප්‍රසංග ගිණුම (රු'000)

| | | | |
|---|---|---|---|
| ගායකයින්ට ගෙවීම් | 200 } | ප්‍රවේශපත්‍ර විකුණුම් | 300 [01] |
| සංගීත කණ්ඩායමට ගෙවීම් | 80 } [01] | අනුග්‍රාහක දීමනා | 500 [01] |
| සංග්‍රහ වියදම් | 30 } | | |
| ශාලා කුලිය | 75 [01] | | |
| අතිරික්තය | 415 | | |
| | 800 | | 800 |

(රු'000)

(iii) ටී - ෂර්ට් විකිණීමෙන් ලද අතිරික්තය - 15 (02)

පෙරවැඩ (රු'000)

ටී - ෂර්ට් විකුණුම් 300 × 250 = 75 [01]
ටී - ෂර්ට් විකුණුම් පිරිවැය 300 × 200 = (60) [01]
15

(ලකුණු 07)

(3) (i) 2016.03.21 දිනට සමුච්චිත අරමුදල 620 (02)

පෙරවැඩ (රු'000)

2015.04.01 සමුච්චිත අරමුදල - 200
අතිරික්තය - 420 [02]
620

ආදායම් ප්‍රකාශනය

ආදායම්

| | | |
|---|---|---|
| සාමාජික මුදල් | 300 | |
| යාවජීව සාමාජික මුදල් | 50 | |
| සංගීත ප්‍රසංගයෙන් | 415 | |
| ටී ෂර්ට් විකිණීමෙන් | 15 | ඕනෑ ම අයිතම 4කට ලකුණු [02] |
| | 780 | |
| **වියදම්** | | |
| පරිපාලක සහයක වැටුප් | (360) | |
| අතිරික්තය | 420 | |

(රු'000)

(ii) යාවජීව සාමාජික අරමුදල (350) (01)

(රු'000)

(iii) සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු මුදල 165 (02)

පෙරවැඩ (රු'000)

ප්‍රවේශපත්‍රවලින් ලැබිය යුතු මුදල - 40 [01]
අනුග්‍රාහකයින්ගෙන් ලැබිය යුතු මුදල - 125 [01]
165

(ලකුණු 05)

ප්‍රශ්න අංක 6

| | 1 | 2 | 3 | එකතුව |
|---|---|---|---|---|
| අ | 07 | 03 | - | 10 |
| ආ | 08 | 07 | 05 | 20 |
| | | | | 30 |

ප්‍රශ්න අංක 7

(අ)(1) විකුණුම් රු. 2 000 000 (02)

පෙරවැඩ

$\frac{400\ 000}{20\%}$ [01] [01] = 2 000 000

(2) සාමාන්‍ය තොගය රු. 200 000 (02)

පෙරවැඩ

$\frac{1\ 600\ 000}{8\%}$ [01] [01] = 200 000

(3) මුළු වත්කම් රු. 4 000 000 (02)

පෙරවැඩ

$\frac{2\ 000\ 000}{0.5\%}$ [01] [01]

(4) හිමිකම් මත ඉපැයුම් අනුපාතය <u>10%</u> (02)

පෙරවැඩ

$$\frac{240\ 000\ [01]}{2\ 400\ 000\ [01]} \times 100 = 10\%$$

(5) හිමිකම් අනුපාතය <u>60%</u> (02)

පෙරවැඩ

$$\frac{2\ 400\ 000\ [01]}{4\ 000\ 000\ [01]} \times 100 = 60\%$$

(ආ)

සීමිත නායගම් පොදු සමාගම
2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (01) රු'000

| | | | |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | | |
| බදු පෙර ලාභය | (64) | (01) | |
| ක්ෂය | 40 | (01) | |
| ලී බඩු විකිණීම මත ලාභය | (16) | (01) | |
| අඩමාන ණය | 16 | (01) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල යෙදවූ මුදල් | (24) | | |
| තොග වැඩි වීම | (80) | (01) | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ අඩු වීම | 40 | (01) | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ අඩු වීම | (8) | (01) | |
| ගෙවිය යුතු වැටුප් වැඩි වීම | 8 | (01) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළ යෙදවූ ශුද්ධ මුදල් (01) | | | (64) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනුම් | (80) | (02) | |
| ලී බඩු විකිණීමෙන් ලද මුදල | 56 | (02) | |
| ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් (01) | | | (24) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | | |
| කොටස් නිකුත් කිරීම | 240 | (01) | |
| ණය ලබාගැනීම | 120 | (01) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් (01) | | | 360 |
| මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩි වීම | | | 272 |
| 2015.04.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ | | | (80) (01) |
| 2016.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ | | | 192 (01) |

(ලකුණු 20)

<u>පෙරවැඩ</u> රු'000

දේපළ, පිරියත සහ උපකරණ ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 240 | | ලී බඩු | 48 [01] |
| | 40 | [01] | ශේෂය ප/ග | 312 |
| මුදල් | 80 | | | |
| | 360 | | | 360 |

ලී බඩු විකුණුම් ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| ලී බඩු | 48 | [01] | සමුච්චිත අගය | 8 [01] |
| ලාභාලාභ | 16 | | මුදල් | 56 |
| | 64 | | | 64 |

ප්‍රශ්න අංක 7

| | 1 | 2 | 3 | 4 | 5 | එකතුව |
|---|---|---|---|---|---|---|
| අ | 02 | 02 | 02 | 02 | 02 | 10 |
| ආ | - | - | - | - | - | 20 |
| | | | | | | 30 |